හම්බන්තොට දිස්ත්‍රික්කය

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

# මත්තල එල්ලංගා පැතිකඩ හා
# එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම

කෘෂිකර්ම අමාත්‍යාංශය

දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය

හම්බන්තොට

2024

# පටුන

01. හැඳින්වීම ....................................................................................................................

1.1. එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය ......................................................................

1.2. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම ..................................................................................

1.3 එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය..........................................................................

1.4 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම ............

1.5 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු ...................

1.6 ප්‍රදේශයේ පවතින එල්ලංගා පිලිබඳ මූලික හැඳින්වීම: ............................................................

1.7 මත්තල එල්ලංගාව.....................................................................................................

1.7.1 මත්තල එල්ලංගා පද්ධතියේ සිතියම ..........................................................................

1.7.2 මත්තල එල්ලංගාවේ වැව් පිලිබඳ තොරතුරු..............................................................

1.8 මත්තල එල්ලංගාව තිරසර ලෙස කළමණාකරනය කිරීමේ වැදගත්කම ....................................

1.9 මත්තල එල්ලංගා පැතිකඩ සකස් කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය ..........................................

02. මත්තල එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය .......

2.1 මත්තල එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම.................................................

03. මත්තල එල්ලංගාවේ වර්තමාන පැතිකඩ .........................................................................

3.1. භූගෝලීය (Geographical ) තොරතුරු ...............................................................................

3.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු..............................................................................

3.3 ජල විද්‍යාත්මක (Hydrological) තොරතුරු........................................................................

3.4 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු.................................................................

3.5 එල්ලංගාව තුල සිදුවන මානව ජීවනෝපාය (Human Livelihood) ක්‍රියාකාරකම් පිලිබඳ තොරතුරු ...........................................................................................................................

3.6 සමාජ ආර්ථික (Socio - Economic) තොරතුරු ...................................................................

3.7 එල්ලංගාව තුල දැනට සිදුකරමින් පවතින ඉදිකිරීම් (Constructions) කටයුතු පිලිබඳ තොරතුරු...

3.8. එල්ලංගා පද්ධතියේ කෘෂිකාර්මික බෝග වගා රටා (Cropping Patterns) පිලිබඳ තොරතුරු .......

3.9. එල්ලංගාවේ වාරිමාර්ග කළමණාකරනය (Irrigation Management) පිලිබඳ තොරතුරු ............

3.10.පෝෂක ප්‍රදේශයේ (Command Area) වර්තමාන තත්වය පිලිබඳ තොරතුරු ............................

04. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග ..........................................................................

4.1 එල්ලංගාවේ උග්‍ර ගැටළු (Critical Issues).........................................................................

4.2. එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ පරමාර්ථ සහ අරමුණු.....................

4.3 එල්ලංගා කළමණාකරන කමිටුව විසින් උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් ..........................................................................................

5. එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම........................................................................

5.1. යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්, වැය වන මුදල සහ පාර්ශවකරුවන්ගෙන් අපේක්ෂිත දල මූල්‍ය දායකත්වය ..........................................................................................................

5.2. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය තුල එමගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන ක්‍රියාකාරකම්.....................................................................

5.3. එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය ....................................

ඇමුණුම් ............................................................................................................................

ඇමුණුම් 01 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍ර ලේඛය........

ඇමුණුම් අංක 02 - හරස්කඩ චාරිකාව සඳහා සහභාගී වූ හවුල්කාර ආයතන වල ලේඛණය ...............

ඇමුණුම් අංක 03 - එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම සහ එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා සහභාගී වූ ආයතන වල ලේඛණය ...........................................................................

ඇමුණුම් අංක 04 - උප ව්‍යාපෘති යෝජනා ආකෘතිය...............................................................

**වගු ලේඛණය**

වගුව 1 - මත්තල එල්ලංගාව පිලිබඳ පරිපාලන තොරතුරු ............................................................
වගුව 2 - එල්ලංගාවේ වැව් පිලිබඳ විස්තර .........................................................................
වගුව 3 - එල්ලංගාවේ ජල පෝෂකයන් පිලිබඳ තොරතුරු ...........................................................
වගුව 4 - මත්තල එල්ලංගා පද්ධතියේ මූලිකාංග.......................................................................
වගුව5 -වාෂ්පීකරණ උත්ස්වේදනය-සෙවනගල..........................................................................

වගුව6 - පෘෂ්ඨීය වාෂ්පීකරණය-තණමල්විල.........................……………………………
වගුව7 - එල්ලංගාවේ පිහිටි වැව් වලට මාසිකව ලැබෙන ජල ප්‍රමාණය ………………………......……………………………………………...
වගුව 8 - පසුගිය කන්න 5 තුල එල්ලංගාව තුල පිහිටි වැව් වල බෝග වගා රටාව...............................
වගුව 9 - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් වැව් පුනරුත්ථාපනයෙන් පසු යෝජිත බෝගවගා
රටාව .............................................................................................................................
වගුව 10 - එක් එක් වැව යටතේ සැලසුම්කරන ලද වගා ඉඩම් ප්‍රමාණය සහ දැනට වගා කරන ඉඩම් ප්‍රමාණය...........................................................................................................................
වගුව 11 - ජලය බෙදා හැරීමේ ඇලවල් හා වගාබිම් ප්‍රමාණයන් ......................................................
වගුව 12 - එල්ලංගාවේ උග්‍ර ගැටළු ......................................................................................
වගුව 13 - අරමුණු සාධනය සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්.....................................................
වගුව 14 - එල්ලංගා පද්ධති කලමණාකරනය සඳහා ක්‍රියාකාරකම්, කාලරාමුව සහ වගකීම් සැලැස්ම (Gannt සටහන ) ..............................................................................................................
වගුව 15 - ඇස්තමේන්තුගත වියදම..........................................................................................
වගුව 16 - උපායමාර්ගික මැදිහත්වීම් වල ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවා ක්‍රියාත්මක කාල රාමුව........

සැලැස්ම …………………………………………………………………………………………………………

…

**සිතියම් ලේඛණය**

සිතියම් අංක 1- මත්තල එල්ලංගාව ආශ්‍රිත ප්‍රදේශයේ සිතියම

**රූප සටහන් ලේඛණය**

රූපසටහන් 1 - එල්ලංගා පද්ධති කලමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන………………………………………………………………………………………………..
රූප සටහන 2 - මත්තල එල්ලංගාව චන්ද්‍රිකා ඡායාරූපයක් ඇසුරින්
රූප සටහන් 3 - එල්ලංගාවේ ඉඩම් පරිහරණ රටාව ........................................................................
රූප සටහන් 4 - මාසික සාමාන්‍ය වර්ෂාපතනය ...........................................................................
රූපසටහන් 5 - කළමණාකරන තොරතුරු ගලා යන ආකාරය

# මත්තල එල්ලංගා පැතිකඩ හා
# එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම

## 1. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති හා අමුණු වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයක් වන අතර, එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසාර පැවැත්ම තහවුරු කරයි.
වාරි ශිෂ්ඨාචාරයේ ඉතාමත් විශිෂ්ඨ නිර්මාණයක් වන එල්ලංගාව ආරක්ෂා කර සංරක්ෂණය කර මනා කළමණාකරනයක් තුලින් සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සහ එල්ලංගා කළමණාකරනය පහසු කිරීම සඳහා එල්ලංගාවේ ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කළමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කළමණාකරනය කිරීම එල්ලංගා කළමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) ව්‍යාපෘති බල ප්‍රදේශයේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමයි. ඒ අනුව එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කරනු ලබයි.

### 1.1. එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය

එල්ලංගාවක්, ජල පෝෂක ප්‍රදේශයේ මතුපිට මෙන්ම භූගත ජල මට්ටම සුරක්ෂිත කරන අතර, එහි ප්‍රතිපලයක් ලෙස ජනතාවට ආහාර පිසීම වැනි ගෘහ කටයුතු සහ වගා කටයුතු වලට ජලය සපයනු ලබයි. රූප සටහන 1 අනුව රාජ්‍ය, පෞද්ගලික සහ ප්‍රතිලාභී පාර්ශවකාර ආයතන එල්ලංගාව ආරක්ෂා කරනු ලබයි. එසේ වුවද අංක 3 කොටසේ සඳහන් පරිදි නියමිත ලෙස පාර්ශවකරුවන්ගේ අවධානය යොමු නොවීම සහ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව දැඩි ලෙස පරිහානියට පත්ව ඇත. එල්ලංගාව ආරක්ෂාව කිරීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ වීමට වඩාත් යෝග්‍ය ආයතන ව්‍යුහයක් නොමැති වීම නිසා එල්ලංගාව තව දුරටත් හානියට ලක් විමේ ප්‍රවනතාවක් පවතී. එම නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව වැනි සම්බන්ධීකරණ ආයතනයක් එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වඩාත් අවශ්‍ය වී ඇත.

### 1.2. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වාරි කළමණාකරනයේ දී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එනම්, ″**එල්ලන්**″ සහ ″**ගාව**″ යන වචන දෙක එකතු වී සකස් වී ඇත. ″**එල්ලන්**″ යනු එල්ලෙන යන්නයි. ″**ගාව**″ යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි. ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ

එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස ද නම් කර ඇත. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා එල්ලංගාවට කළමණාකරන සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. එසේම එල්ලංගා කළමණාකරන කමිටු නීතිගත කිරීමට ද අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. පරිපාලන දිස්ත්‍රික්ක 11 කට අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කළමණාකරන කමිටු 53 ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබා දේ.

එල්ලංගා කළමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඒවා නම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ගොවි සංවිධාන, ප්‍රජා මූල සංවිධාන, ජල සම්පත් මණ්ඩලය, ආපදා කළමණාකරන කාර්යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය, පරිසර අධිකාරිය, පෞද්ගලික අංශය, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව යන ආයතන වේ. එල්ලංගා කළමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම යි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇති අතර, ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහන 1 මගින් දක්වා ඇත.

*රූපසටහන 1: එල්ලංගා පද්ධති කළමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන*




## 1.3. එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා අතීතයේ පැවති සාම්ප්‍රදායික ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිළිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර, ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේ දී, සම්පත් හායනය වලක්වා ගැනීමේ දී හා මනා කලමණාකරනයක් කිරීමේ දී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර

විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිළිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කරනු ලබයි. මෙම එල්ලංගා පැතිකඩ එල්ලංගා පද්ධති කළමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

## 1.4. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එළිපෙහෙළි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිළිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවි ප්‍රජාවට එල්ලංගාව පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මක් සැකසීම (Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කළමණාකරන සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කරනු ලබයි.

## 1.5. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ ඒවායේ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කළමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කළමණාකරනය කල යුතු වේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කළමණාකරන සැලැස්ම සකස් කරනු ලබයි.

1.5.1. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිළිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ (Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම .


1.5.2. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත් වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම.

1.5.3. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

## 1.6. ප්‍රදේශයේ පවතින එල්ලංගා පිලිබඳ මූලික හැඳින්වීම

කිරිදි ඔය ගංගා ද්‍රෝණියේ එල්ලංගා පද්ධති 02 ක් පිහිටා ඇත. ඒවා නම් මත්තල එල්ලංගාව සහ වීරවිල එල්ලංගාවයි. මෙම එල්ලංගා 02 ම වීරවිල ගොවි ජන සේවා බල ප්‍රදේශය තුල පිහිටා ඇත. මත්තල එල්ලංගාව වර්ග කිලෝමීටර් 22.0 ක් විශාල වන අතර, එහි වැව් 09 ක් පිහිටා ඇත.

සිතියම 01- මත්තල එල්ලංගාව ඇතුලත් ප්‍රදේශය




මූලාශ්‍රය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරවිල ගොවිජන සේවා බල ප්‍රදේශයේ උඩමත්තල සහ පහල මත්තල ග්‍රාම නිලධාරී වසම තුල මත්තල එල්ලංගා පද්ධතිය පිහිටා ඇත. මෙම එල්ලංගා පද්ධතියේ වැව් 09 ක් පමණ තිබේ. මෙම එල්ලංගා පද්ධතිය වර්ග කි.මී 22.07(හෙක්ටයාර් 2207.35) ක් පමණ වූ භූමි භාගයක ව්‍යාප්ත වී ඇත. භූමියේ පිහිටීම අනුව එල්ලංගාවේ මායිම මුහුදු මට්ටමේ සිට මීටර් 0–100 ක් පමණ උස වන අතර, එල්ලංගා පද්ධතියේ ඉහල මායිමේ උස මීටර් 100 ක් පමණ වේ. හුදකලා කඳු කිහිපයක් හැරුණු විට සම්පූර්ණ එල්ලංගා පද්ධතියම මීටර් 100 කට වඩා අඩු උසකින් යුත් සාමාන්‍ය තැනිතලා භූමියකි. □□□ □□□ □□□□ ආශ්‍රිත ප්‍රදේශයේ දැකිය හැකි ප්‍රධානම ඉඩම් පරිහරණයන් වන්නේ ළදුකැලෑ, හේන්, කුඹුරු, විවෘත වනාන්තර සහ ගෙවතු වේ.

වගුව 1. මත්තල එල්ලංගාව පිලිබඳ පරිපාලන තොරතුරු


| මූලික තොරතුරු | විස්තර | විශේෂිත කරුණු |
|---|---|---|
| දිස්ත්‍රික්කය | හම්බන්තොට | – |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ලුණුගම්වෙහෙර | – |
| මැතිවරණ බල ප්‍රදේශය | තිස්සමහාරාමය | – |
| ගංගා ද්‍රෝණිය | කිරිදි ඔය | – |
| එල්ලංගාව | මත්තල | – |
| ග්‍රාම නිලධාරී වසම/වසම් | උඩ මත්තල(48),<br>පහල මත්තල(49) | |
| එල්ලංගාවේ භූමි ප්‍රමාණය | හෙක්ටයාර් 2207.35 | |
| කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන වැව් සංඛ්‍යාව | වැව් 09 | |
| පැහැදිලිව හඳුනා ගත හැකි ජල පෝෂක ප්‍රදේශ | | – |

| | | |
|---|---|---|
| රක්ෂිත | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් හෙක්ටයාර් 1718.73 ක් මෙම එල්ලංගාව තුල පිහිටා ඇත. | |
| පෝෂක ප්‍රදේශයේ පදිංචි පවුල් සංඛ්‍යාව | | |
| වනාන්තර තුල පිහිටි වැව් සංඛ්‍යාව | 03 | |
| එල්ලංගාව තුලින් ජීවනෝපාය සැලසෙන පවුල් සංඛ්‍යාව | 160 | |

මූලාශ්‍රය - ගොවි සංවිධාන/වීරවිල ගොවි ජන සේවා මධ්‍යස්ථානය

## 1.7.1. මත්තල එල්ලංගා පද්ධතියේ සිතියම

පැවති මත්තල එල්ලංගා පද්ධතියේ සිතියම යාවත්කාලීන වී නැත. එම නිසා වඩාත් නිවැරදි සිතියමක් එල්ලංගා පැතිකඩට ඇතුලත් කිරීමේ අපේක්ෂාවෙන් හරස්කඩ වාරිකාවේ දී එකතු කර ගන්නා ලද දත්ත පදනම් කරගෙන නව සිතියමක් නිර්මාණය කරන ලදී.
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද නව සිතියම, සිතියම අංක 02 යටතේ පහත දැක්වේ.




රූප සටහන **01** මත්තල එල්ලංගාව චන්ද්‍රිකා ඡායාරූපයක් ඇසුරින්

මූලාශ්‍රය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

## 1.7.2 මත්තල එල්ලංගාවේ පවත්නා වැව් පිලිබඳ තොරතුරු

මෙම එල්ලංගාවේ වැව් 09 ක් ඇත. එල්ලංගාවේ පිහිටි එම වැව් පිළිබඳ තොරතුරු පහත වගු අංක 02 හි දැක්වේ.

*වගුව 1- එල්ලංගාවේ වැව් පිලිබඳ විස්තර*

| අනු අංකය | වැවේ නම | ග්‍රාම නිළධාරි වසම | වැවේ පිහිටීම දැක්වෙන බණ්ඩාංක | | ජල ධාරිතාවය අක්කර/ අඩි | පෝෂක ප්‍රදේශය (හෙක්ටයාර්) | ගොවි පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | | අක්ෂාංශ (අංශක) | දේශාංශ (අංශක) | | | |
| 1 | පහල මත්තල වැව | පහල මත්තල/ උඩ මත්තල | 6.319422 | 81.11334 | | 59.60 | |
| 2 | පලුජඳුර වැව | උඩ මත්තල | 6.3222 | 81.1231 | 30 | 4.13 | 27 |
| 3 | මුල්පිට වැව | පහල මත්තල | 6.325191 | 81.109869 | | 6.93 | |
| 4 | ඔරුකෙම්ගල වැව | උඩ මත්තල | 6.327120 | 81.132741 | | 2.38 | |
| 5 | උඩ මත්තල වැව | උඩ මත්තල | 6.338540 | 81.129982 | 200 | 19.14 | 78 |
| 6 | ලුණුවැරණිය වැව | උඩ මත්තල | 6.345435 | 81.120674 | 28 | 4.56 | 14 |
| 7 | කුඩා නෙරළුගස් වැව | උඩ මත්තල | 6.349 | 81.1364 | 18 | 3.11 | 06 |
| 8 | පළුගස් වැව | උඩ මත්තල | 6.349747 | 81.128806 | 32 | 5.55 | 32 |
| 9 | කොඩයන්බැදි වැව | උඩ මත්තල | 6.355792 | 81.103558 | | 0.16 | |
| **එකතුව** | | | | | | **105.56** | |

මූලාශ්‍රය - ගොවි සංවිධාන / වීරවිල ගොවිජන සේවා මධ්‍යස්ථානය

## 1.8. මත්තල එල්ලංගාව තිරසර ලෙස කළමණාකරනය කිරීමේ වැදගත්කම

මත්තල එල්ලංගාවේ වැව් 09 යටතේ දල වශයෙන් හෙක්ටයාර් 365.83 පමණ මහ කන්නයේ වී හා ගොඩ බෝග වගා කරනු ලබයි. එම ගොවීන් සංඛ්‍යාව 170ක් පමණ වේ. කුඹුරු වගා ගොවීන් සහ හේන් වගා ගොවීන් එල්ලංගාවෙන් ජීවනෝපාය සලසා ගන්නා අතර ඔවුන් කුඩා වැව් වලින් ලැබෙන ජලය හා වාර්ෂාවෙන් ලැබෙන ජලය ප්‍රයෝජනයට ගෙන වගා කටයුතු සිදු කරනු ලබයි. කෙසේ වුවද මෑතකදී එල්ලංගා පැතිකඩ සංවර්ධනය සඳහා සිදු කරනු ලැබූ සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ වාරිකාවෙන් හා අදාල ලේඛණ පරිශීලනය මගින් එකතු කරන ලද, ජනනය කරන ලද දත්ත හා


තොරතුරු තුලින් එල්ලංගාවේ විවිධ අංශ විවිධ හේතු නිසා හානියට පත් වී ඇති බව අනාවරනය විය. කෙසේ වුවද එල්ලංගාවේ පිහිටි වැව් 09 එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී කරගනිමින් ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර, එහි දී මුළු පද්ධතියේ තිරසර පැවැත්ම තහවුරු වන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි. ඒ අනුව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර බැමිණියාව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අවධානය යොමු කර ඇත. එහිදී එල්ලංගා කළමණාකරන කමිටුවට එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමට ව්‍යාපෘතිය සහාය ලබා දේ.

## 1.9. මත්තල එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ දී භාවිතා කල ක්‍රමවේදය

ඡායාරූපය 1.

මත්තල එල්ලංගා පැතිකඩ සකස් කිරීම සඳහා මූලාංශ්‍ර කිහිපයක් ඔස්සේ තොරතුරු ලබා ගන්නා ලදී. හරස්කඩ චාරිකා, ද්විතීයික දත්ත, කණ්ඩායම් සාකච්ඡා ඒ අතර ප්‍රධාන වූ අතර, ද්විතීයික දත්ත ලෙස ව්‍යාපෘතියේ සංවේදී කලාප සඳහා සකස් කරන ලද කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම, ඉංජිනේරු සමීක්ෂණය, ජල විද්‍යාත්මක තක්සේරුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වලින් ලබා ගත් තොරතුරු භාවිතා කරන ලදී. මීට අමතරව ප්‍රාථමික දත්ත ජනනය කිරීම සඳහා හරස්කඩ චාරිකාවක්ද (Transect Walk) සියලු පාර්ශවකාර සංවිධානවල සහභාගීත්වයෙන් සිදුකරන ලදී.

සිතියම 2.        හරස්කඩ චාරිකාවට අදාල සිතියම




එල්ලංගාවේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශ සියල්ල ආවරණය වන පරිදි එල්ලංගාවේ අවසන් වැව වන පහළ මත්තල වැව දක්වා කණ්ඩායම් 4 ක් මගින් ……………... දින පැවැති හරස්කඩ චාරිකාවේදී තොරතුරු ලබා ගන්නා ලදී. මෙම හරස්කඩ චාරිකාවේදී එක් කණ්ඩායමක් කොඩයන්බැදි වැව සහ පළුගස් වැව ද, තවත් කණ්ඩායමක් ලුණුවැරණිය වැව, කුඩා නෙරළුගස් වැව සහ උඩ මත්තල වැව

ආශ්‍රිත ප්‍රදේශය ද, තවත් කණ්ඩායමක් ඔරුකෙම්ගල වැව, පලුජදූර වැව සහ පහල මත්තල වැව ආශ්‍රිත ප්‍රදේශය ද, අනෙක් කණ්ඩායම මුල්පිට වැව ආශ්‍රිත ප්‍රදේශය ද ආවරණය කරන ලදී. මෙම හරස්කඩ චාරිකාවේදී ගමන් මාර්ගයේ මීටර් 100 න් 100 ට තොරතුරු ලබා ගන්නා ලද අතර ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජ ආර්ථික තොරතුරු, සම්පත් භායනය හා සම්පත් භායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කර ගන්නා ලදී. හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන් ගොවි සංවිධාන සාමාජිකයින් හා සියලු රාජ්‍ය ආයතන වල නිලධාරීන් සහභාගී වූ අතර, චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් වැඩමුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තවදුරටත් තහවුරු කරගන්නා ලදී.

විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වන අතර, එල්ලංගාව අධ්‍යයනය කරනු ලබන අයට එල්ලංගාව පිලිබඳව තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේ දී බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 1.10. මත්තල එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, මත්තල එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කළමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීමට සඳහා එල්ලංගා කළමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කළමණාකරන සැලැස්මක් අවශ්‍ය බවටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කළමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිලිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතියික හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. ( I ) රැස්වීම් පැවැත්වීම (ii) ද්විතීයික දත්ත

එකතු කිරීම (iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම (iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම (v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම (vi) එල්ලංගා පැතිකඩ සැකසීම (vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම (viii) එල්ලංගා සැලැස්ම සැකසීම (ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කර ගැනීම (x) එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම් සකස් කිරීම (xi) යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු තීරණය කිරීම, දල ඇස්තමේන්තුවක් සකස් කිරීම ආදිය එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්මට ඇතුලත් කරන ලදී.

## 2.1. මත්තල එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

මත්තල එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6 ක දිස්ත්‍රික්ක 11 ක එල්ලංගා පද්ධති **57** ක් ආවරණය වන පරිදි එල්ලංගා කළමණාකරන කමිටු 53 ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි .එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරිම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශිලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගාව හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි 4 වන කොටස යටතේ දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී. ඒවා නම් 1. භූගෝල විද්‍යාත්මක 2. භූ විද්‍යාත්මක 3. ජල විද්‍යාත්මක 4. පාරිසරික විද්‍යාත්මක 5. මානව හැසිරීම් 6. සමාජ ආර්ථික 7. කෘෂිකාර්මික 8. වාරිමාර්ග කලමණාකරන 9. පෝෂිත ප්‍රදේශයේ තත්වය යන ආදියයි. මේවා එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේදී


භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

## 3. මත්තල එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

### 3.1. භූගෝලීය (Geographical ) තොරතුරු

මත්තල එල්ලංගා පද්ධතිය ඇතුලත් ප්‍රදේශයෙහි භූ විෂමතාවය සහ ජලවහනය ඇතුලත් සිතියම පහත අංක 3 යටතේ දක්වා ඇති අතර, ඒ අනුව අදාල ප්‍රදේශය මුහුදු මට්ටමේ සිට මීටර් 0 - 100 දක්වා වූ උන්නතාංශයකින් යුතු වේ.


සිතියම 3 - භූ විෂමතාවය සහ ජලවහනය-මත්තල එල්ලංගා පද්ධතිය




මූලාශ්‍රය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

## 3.2. භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

මත්තල එල්ලංගා පද්ධතියම DL 5 කෘෂි පාරිසරික කලාපයට ඇතුලත් වන අතර, මූලික වශයෙන් ප්‍රදේශයේ බහුල වශයෙන් රතු දුඹුරු පස ඇත. එහෙත් කුඹුරු වල ලොම් පස පවතී. මත්තල □□□□□□□□□ ආශ්‍රිත ප්‍රදේශයේ දැකිය හැකි ප්‍රධානම ඉඩම් පරිහරණයන් වන්නේ ළදුකැලෑ, හේන්, කුඹුරු සහ ගෙවතු වේ.




*සිතියම 4-මත්තල එල්ලංගාවේ වර්තමාන ඉඩම් පරිහරණය*

**මූලාශ්‍රය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

*වගුව 3 - ඉඩම් පරිහරණ දත්ත*

| **ඉඩම් පරිහරණ වර්ගය** | **බිම් ප්‍රමාණය(හෙක්ටයාර්)** |
| --- | --- |
| පුරාවිද්‍යාත්මක, ආගමික සහ සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථාන | 3.27 |
| ගල් පර්වත | 1.41 |
| පළතුරු භෝග වගා ඉඩම් | 1.03 |
| ගෙවතු | 143.30 |
| අධිවේගී මාර්ගය සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් | 13.97 |
| ජලතල | 120.43 |
| විවෘත වනාන්තර | 148.13 |
| කුඹුරු | 151.24 |
| පොදු පහසුකම් සඳහා වෙන් කල ස්ථාන | 0.54 |
| ළඳු කැලෑ | 1410.47 |
| හේන්(අතිරේක ආහාර භෝග) | 213.56 |

*රූප සටහන 02 - ඉඩම් පරිහරණ රටාව*

## 3.3. ජල විද්‍යාත්මක (Hydrological) තොරතුරු

එක් එක් ජල පහරවල් සහ ඒවායේ ජල පෝෂක ප්‍රදේශ පහත වගු අංක 03 හි දක්වා ඇත.

*වගුව 3 - එල්ලංගාවේ ජල පෝෂකයන් පිලිබඳ තොරතුරු*

| ජල පෝෂකය | පෝෂක ප්‍රදේශය (වර්ග කි.මී) |
|---|---|
| | |
| | |
| | |
| | |

මූලාශ්‍රය -ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව


සාමාන්‍යයෙන් සම්ප්‍රදායික එල්ලංගාවක නිශ්චිත, සම්මත මූලිකාංග රාශියක් ඇත. ඒ අතර මත්තල එල්ලංගාවේ ප්‍රධාන මූලිකාංග වගු අංක 5 හි දැක්වේ.


*වගුව 4 - මත්තල එල්ලංගා පද්ධතියේ මූලිකාංග*

| ජල විද්‍යාත්මක ලක්ෂණ | වර්තමාන තත්වය |
|---|---|
| කුළු වැව | |
| ඔලගම් වැව | |
| ඉහළ වැව | |
| කායන් වැව | |
| මහ වැව | |
| ගොඩ වල | |
| ඉස්වැටිය | |

මූලාශ්‍රය - එල්ලංගා කලමණාකරන කමිටුව විසින් පවත්වන ලද හරස්කඩ චාරිකාවේ දී රැස් කල තොරතුරු

රූප සටහන 03 - කාලගුණය සහ දේශගුණය සඳහා දත්ත සහ ප්‍රස්තාර-මත්තල
එල්ලංගාව ආශ්‍රිත ප්‍රදේශය




මෙහි දේශගුණය නිවර්තන වේ.Köppen සහ Geiger අනුව දේශගුණය Aw ලෙස වර්ගීකරණය කර ඇත.මත්තල සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 26.9 °C කි .මෙහි වාර්ෂික වර්ෂාපතනය ආසන්න වශයෙන් 1073 mm කි.

වියළිම මාසය ජූලි වේ.මිලිමීටර් 31 ක වර්ෂාපතනයක් ජූලි මාසයේ දී ලැබේ. වැඩිම වර්ෂාපතනයක් නොවැම්බර් මාසයේ දී ලැබෙන අතර, එහි සාමාන්‍ය අගය මිලිමීටර් 221 දක්වා ළඟා වේ.

ජූලි යනු වසරේ උණුසුම්ම මාසයයි. ජූලි මාසයේ සාමාන්‍ය උෂ්ණත්වය 28.0 °C කි. දෙසැම්බර් මාසයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 25.3ක් වන අතර, වසර පුරා වඩාත්ම අඩු උෂ්ණත්වය මෙම මාසයේ දී වාර්තා වේ.

වියළිම සහ තෙත් මාස අතර වර්ෂාපතනයෙහි 190 mm වෙනසක් ඇත. වසරක් පුරාවට සාමාන්‍ය උෂ්ණත්වය 2.7 °C කින් උච්චාවචනය වේ.

නොවැම්බර් (83.98%) වැඩිම සාපේක්ෂ ආර්ද්‍රතාවය ඇති අතර ජූලි (69.31%) අඩුම අගයක් අත්විදින බව නිරීක්ෂණය කෙරේ. වැඩිම වර්ෂාපතනයක් ලැබෙන මාසය නොවැම්බර් (වර්ෂා දින 21) වන අතර, අඩුම වර්ෂාපතනයක් ඇති මාසය පෙබරවාරි (දින 07) වේ.

වගුව 5 -1993-2023 දක්වා වූ කාලය තුල උෂ්ණත්ව සහ වර්ෂාපතන දත්ත -මත්තල එල්ලංගාව ආශ්‍රිත ප්‍රදේශය

| | ජනවාරි | පෙබර. | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්. | සැප්තැ. | ඔක්. | නොවැ. | දෙසැම්. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාමාන්‍ය උෂ්ණත්වය °C | 25.4 | 26.2 | 27.1 | 27.3 | 27.8 | 27.9 | 28.0 | 27.8 | 27.5 | 26.8 | 25.7 | 25.8 |
| අවම උෂ්ණත්වය °C | 21.9 | 22.3 | 23.1 | 24.2 | 25.2 | 25.2 | 25.4 | 24.8 | 24.5 | 23.9 | 23.0 | 23.5 |
| උපරිම උෂ්ණත්වය °C | 29.4 | 30.7 | 31.9 | 31.5 | 31.7 | 31.9 | 32.5 | 32.4 | 32.0 | 31.0 | 29.0 | 28.6 |
| වර්ෂාපතනය මි.මී | 64 | 45 | 64 | 120 | 85 | 44 | 31 | 37 | 69 | 156 | 221 | 157 |
| ආර්ද්‍ර තාවය(%) | 76 | 73 | 73 | 80 | 77 | 72 | 69 | 70 | 72 | 77 | 84 | 81 |
| වර්ෂා දින | 8 | 5 | 8 | 15 | 12 | 9 | 7 | 8 | 11 | 14 | 16 | 13 |

මූලාශ්‍රය- Climate Data.Org

මත්තල එල්ලංගාවට ඉතා ආසන්නයේ පිහිටි සෙවනගල මධ්‍යස්ථානයේ වාෂ්පීකරණ උත්ස්වේදන දත්ත පහත වගු අංක 6හි දැක්වේ.

*වගුව 6 - වාෂ්පීකරණ උත්ස්වේදනය - සෙවනගල*

| මාසය | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාෂ්පීකරණ උත්ස්වේදනය (මිලි මීටර්) | 117 | 129 | 150 | 136 | 120 | 140 | 123 | 141 | 108 | 95 | 100 | 89 |

මූලාශ්‍රය - ජල විද්‍යා වාර්ෂික වාර්තාව - වාරිමාර්ග දෙපාර්තමේන්තුව 2019/2020

ඉහත වගුව අනුව වැඩිම වාෂ්පීකරණ උත්ස්වේදනයන් ජූලි මාසයේ සිදු වන අතර, අඩුම වාෂ්පීකරණ උත්ස්වේදනය ඔක්තෝබර් මාසයේ සිදු වේ.

තවද එල්ලංගා බල ප්‍රදේශයේ සම්මත මාසික පෘෂ්ඨීය වාෂ්පීකරණය (Pan evaporation) පිලිබඳ තොරතුරු පහත අංක 7 හි දැක්වේ.

*වගුව 7 - පැන් වාෂ්පීකරණය - තණමල්විල*

| මාසය | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පැන් වාෂ්පීකරණය | 99 | 106 | 116 | 105 | 100 | 121 | 158 | 158 | 146 | 120 | 77 | 88 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා ජල විද්‍යා අත් පොත (2018/19)

ඉහත වගුව අනුව වැඩිම පෘෂ්ඨීය වාෂ්පීකරණයක් ජුනි සිට සැප්තැම්බර් දක්වා පවතින බව සනාථ වේ.

*වගුව 8 - එල්ලංගාවේ පිහිටි වැව් වලට මාසිකව ලැබෙන ජල ප්‍රමාණය*

| වැව | මාසිකව ලැබෙන ජල ප්‍රමාණය (අක්කර අඩි) | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
| පහල මත්තල වැව | | | | | | | | | | | | |
| පළුජදූර වැව | | | | | | | | | | | | |
| මුල්පිට වැව | | | | | | | | | | | | |
| ඔරුකෙම්ගල වැව | | | | | | | | | | | | |
| උඩ මත්තල වැව | | | | | | | | | | | | |
| කුඩා නෙරළුගස් වැව | | | | | | | | | | | | |
| ලුණුවැරණිය වැව | | | | | | | | | | | | |
| පළුගස් වැව | | | | | | | | | | | | |
| කොඩයන්බැදි වැව | | | | | | | | | | | | |

මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සිදුකරන ලද ජල විද්‍යාත්මක තක්සේරු වාර්තාව -2021

තවද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් මෙම එල්ලංගාවේ සිදු කරන ලද ජල විද්‍යාත්මක තක්සේරුව අනුව එල්ලංගා පද්ධතියට ලැබෙන වර්ෂාවෙන් භූගත ජල සැපයුම, වාෂ්පීකරණය, වාෂ්පී උත්ස්වේදනය වගාව සඳහා ප්‍රයෝජනයට ගැනීම යනාදියෙන් පසුව යල කන්නයේ දී එල්ලංගාවේ අවසාන වැව වන පහල මත්තල වැවෙන් අක්කර අඩි …... ක් ද මහ කන්නයේ දී අක්කර අඩි …...ක් ද මුහුදට ගලා යයි. එහෙත් ව්‍යාපෘතිය මගින් වැව් පුනරුත්ථාපනය කිරීම සහ පවතින බෝග වගා රටාව වෙනස් කිරීම මගින් එම ප්‍රමාණය යල කන්නයේ දී …... ක් සහ මහ කන්නයේ දී …... ක් දක්වා අඩු කර ගැනීමට සැලසුම් කර ඇත.

## 3.4. පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

මත්තල එල්ලංගාව අවට පිහිටා ඇති වනාන්තර වර්ග ලෙස වියළි විවෘත වනාන්තර හා කටු පඳුරු සහිත ලඳු කැලෑ බහුලව දැකිය හැකි වේ. මෙම ප්‍රදේශයේ පිහිටි වනාන්තරය මත්තල කැලය ලෙස

හඳුන්වයි. මෙම වන කලාපය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිත වනාන්තරයකි. මෙහි විශාල ප්‍රමාණයේ ශාක වර්ග වශයෙන් පලු, කටුපිල, සියඹලා, කොහොඹ ශාක විශේෂ බහුලව පවතී. පඳුරු වශයෙන් එරමිණියා, රණවරා, මලිත්තන්, අන්දර, පොඩිසිංමරන් විශාල වශයෙන් පවතී. මීට අමතරව මෙම එල්ලංගාවෙහි සත්ව විශේෂ ලෙස අලියා සහ වල් මී හරකා වැනි සතුන් ද. ඉත්තෑවන්, මීමින්නන් වැනි කුඩා සතුන් ද දැකිය හැක.

මීට අමතරව උරග විශේෂ ලෙස තලගොයා, කබරගොයා, ගැට කිඹුලා, හැල කිඹුලන් හා සර්ප විශේෂ ලෙස නයා, පිඹුරා, පොළඟා, ඇහැටුල්ලා, වල් ගැරඬියා, අහර කුක්කා, මාපිලා, තෙල් කරවලා වැනි සතුන්ද කටුසු වර්ග ලෙස පලා කටුස්සා, ගරා කටුස්සන්, අං කටුස්සන් හා බෝදිලිමා වැනි විශේෂද හූනු විශේෂ ලෙස සුලභ ගේ හූනන්, තිත් හූනන් හා කිඹුල් හූනන් හමුවේ. මෙම ප්‍රදේශයේ දුර්ලභ ගනයේ පක්ෂීන් විශේෂ ලෙස අළු කොහා, සිලිබිල්ලා, නිල් කිතලා, ලතුවැකියා, රත්මල් කිරලා දැකිය හැක. ආවේණික සතුන් ලෙස තරු ඉබ්බන් සිටියි. තවද වඳ වී යන සත්වයින් ලෙස කැබැල්ලෑවන්, හම්බාවන් එල්ලංගාව තුල ජීවත් වේ.

වනාන්තර වලින් ලබා ගන්නා සේවාවන් ලෙස මිනිසුන් දර කඩා ගැනීමට වනය නිතර භාවිතා කෙරේ. මීට අමතරව දිවුල්, පලු, වීර වැනි පලතුරු සොයාගැනීමට මිනිසුන් වනාන්තරය භාවිතා කරයි. සත්ව පාලනයේ යෙදෙන ගොවීන් තණකොල හා අනෙකුත් සතුන්ගේ ආහාර සඳහා සතුන් වනාන්තර වලට මුදා හරී. ඇතැම් පුද්ගලයින් වැලි හා පස් ලබා ගැනීමට මෙම වනාන්තර භූමි භාවිතා කරයි. ධීවර ප්‍රජාවට මිරිදිය මත්ස්‍යයින් අල්ලා ගැනීමට වනාන්තර ආශ්‍රිත වැව් භාවිතා කිරීම ද සුලභව සිදු වේ.

එල්ලංගාව ආශ්‍රිතව පරිසර පද්ධතිය මානව ක්‍රියාකරකම් හේතුවෙන් බෙහෙවින් බලපෑමට ලක්ව ඇති බව නිරීක්ෂණය විය. වැව් ඉහත්තාවේ පෝෂක ප්‍රදේශයේ සිදුවන අනවසර හේන් වගාව නිසා පාංශු ඛාදනය අධික වී ඇත. විශේෂයෙන්ම හේන් වගාව නිසා පසේ ජලය උරා ගැනීමේ හැකියාව අඩු වී ඇති අතර ලැබෙන ජලය පස් ද සෝදා ගෙන පහලට ගමන් කරයි. මේ නිසා භූගත ජල මට්ටමද පහල ගොස් ඇත. එසේම විද්‍යානුකූල ක්‍රමවේදයකින් තොරව සිදු කරන මෙම අනවසර හේන් වගාවේ සී සෑම මගින් බිම් සකස් කිරීම නිසා වර්ෂාවත් සමඟ පස් සෝදාගෙන විත් ජලමාර්ග වල හා වැව් වල රොන්මඩ තැන්පත් වේ. විශේෂයෙන්ම එල්ලංගාවේ සිදු වන හේන් වගාව සඳහා කැලය කැපීම නිසා වනගහනය ක්‍රමානුකූලව අඩු වෙමින් පවතී. හේන් වගාකරුවන්ගෙන් 50% කට වඩා වැඩි සංඛ්‍යාවක්, භූමි මාරු කරමින් හේන් වගාවේ නිරත වනු දක්නට ලැබුනි. හේන් වගාකරුවන් විසින් ස්වාභාවිකව ගලා යන ජල මාර්ග හරස් කර තම වගාවන්ට ජලය යොදා ගැනීම නිසා එල්ලංගාවේ ස්වාභාවික ලෙස ජලය ගලා යෑමට බාධා ඇති වී තිබේ.

එල්ලංගාව තුල වගා කරනු ලබන සෑම ඉඩමකටම විදුලි වැටවල් යෙදීම නිසා සතුන්ගේ ගමනාගමනයට බාධා වී ඇති අතර මේ නිසාම අලි මිනිස් ගැටුම උග්‍ර වී ඇත. එසේම සෑම වැවකම වැව් රක්ෂිතය දක්වා වගා කර ඇති අතර මේ නිසා වැව ආරක්ෂාව සඳහා තිබූ ගස් ගොම්මන විනාශ වී ඇත.

එල්ලංගාවේ සිදුවන කෘෂිකාර්මික ක්‍රම බොහෝමයක් දැකගත හැකිය. මෙහිදී හේන් වගාවන් බහුලව සිදු වේ. මෙහිදී සිදු වන වනාන්තර එලි පෙහෙලි කිරීම් එල්ලංගාවේ පැවැත්මට දැඩි තර්ජනයක් වී ඇත.

## 3.5. එල්ලංගාව තුල සිදුවන මානව ජීවනෝපාය (Human Livelihood) ක්‍රියාකාරකම් පිලිබඳ තොරතුරු

එල්ලංගාව තුල කෘෂිකාර්මික කටයුතු සඳහා හෙක්ටයාර් 365.83 ක් පමණ යොදා ගෙන ඇත. හේන් වගාව සඳහා යොදා ගෙන ඇති ඉඩම් සෑම මාස් කන්නයකම වගා නොකරන අතර, දළ වශයෙන් හෙක්ටයාර් 213.56 ක් පමණ මාස් කන්නයේදී වගාව කරනු ලබයි. ඉතිරිය ලඳු කැලෑ වශයෙන් පවතී. එසේම දැනට වගා කරන ඉඩම් වල පමණක් හේන් වගා කිරීමට අවසර ලබාදෙන නමුදු ගොවීන් අනවසරයෙන් වනාන්තර එලිපෙහෙලි කර හේන් වගාව සඳහා යොදා ගැනීම නිසා එල්ලංගාවේ වනාන්තර බිම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. හේන් වගා ඉඩම් වල රටකජු, මුං ඇට ප්‍රධාන වශයෙන් වගා කරන අතර මීට අමතරව මිරිස් වගාවද දක්නට ලැබේ. කෘෂිකාර්මික ඉඩම් පරිහරණය රටාව ගත් විට මාස් කන්නයේ හේන් වගාව සිදු කරනු ලබන අතර යල කන්නයේ ජලය හිඟ වීම නිසා හේන් වගාව සිදු කරනු නොලබයි. විශේෂයෙන්ම හේන් වගාවේදී කිසිදු පාංශු සංරක්ෂණ ක්‍රමයක් භාවිතා නොකරන බැවින් එය එල්ලංගාවේ විශාල පාරිසරික ගැටළුවක් බවට පත් වී ඇති අතර එය එල්ලංගාවේ පැවැත්ම කෙරේ බෙහෙවින් බලපා ඇත. මෙය එල්ලංගාවේ පැවැත්ම කෙරේ බලපා ඇති විශාල තර්ජනයක් වන අතර කඩිනමින් අවිධිමත් හේන් වගාව විධිමත් කෘෂිකාර්මික ක්‍රම යටතේ සුක්ෂම බෝග වගා රටාවක් දක්වා වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

නිදැල්ලේ ගවයින් ඇති කිරීම එල්ලංගාවේ පැවැත්මට විශාල තර්ජනයක් වී ඇති අතර, එල්ලංගාව තුල එල ගවයින් හා මී ගවයින් …... ක් පමණ සිටින බව හරස්කඩ චාරිකාවේදී නිරීක්ෂණය විය. මෙම නිදැල්ලේ ඇති කරන ගවයින් නිසා වැව් වල රොන්මඩ තැන්පත් වීම, ජලජ ශාක වර්ධනය මෙන්ම වැව් කණ්ඩි හා ඇළවල් විනාශ වීමටද ලක් වේ.

විශේෂයෙන්ම වැව් තුලම ගවගාල් ඉදිකර සත්ව පාලන කටයුතු කරන අතර, මෙවැනි ගව ගාල් උඩමත්තල වැව ආශ්‍රිතව හරස්කඩ චාරිකාවේ දී දක්නට ලැබුනි.

## 3.6. සමාජ ආර්ථික (Socio - Economic) තොරතුරු

මත්තල එල්ලංගාව ග්‍රාම නිලධාරි වසම් 02කට අයත් වේ. එනම් උඩ මත්තල සහ පහල මත්තල වේ. උඩ මත්තල වසමෙහි මුළු ජන සංඛ්‍යාව 902 ක් වන අතර, පහල මත්තල වසමෙහි මුළු ජන සංඛ්‍යාව 767 කි. කෙසේ වෙතත් මේ වනවිට පවුල් …... ක් පමණ පදිංචි වී ඇති අතර, පවුල් …... පමණ කෘෂිකාර්මික කටයුතු සඳහා එම කටයුතු සිදු කරන කාලවලදී එල්ලංගාවට පැමිණේ. කෘෂිකාර්මික කටයුතු සිදුකරන කාලයේදී තාවකාලික පැල්පත් සාදා ගෙන ගොවීන් පමණක් රාත්‍රී කාලය ගත කරන අතර, අස්වනු නෙලා ගැනීමෙන් පසුව ඉවත්ව යයි. වැව් වල ජලය තිබෙන යල කන්න වලදී මුං හෝ

වෙනත් කෙටි කාලීන බෝග වැව් යටතේ වගා කරන අතර ඒවා ව ගා කරන ගොවීන් එම කාලයේද එල්ලංගාව තුල පදිංචි වී සිටී.

මාස් කන්නයේදී ගොවීන් 170 ක් පමණ වැව් යටතේ ඇති කුඹුරු ඉඩම් වල, ජල ධාරා ප්‍රදේශ වල වගා කරන අතර වගා කරන ඉඩම් ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 365.83 ක් පමණ වේ. විශේෂයෙන්ම වැව් රක්ෂිත වල හා ජලමාර්ග ප්‍රදේශ වල මෙම ගොවීන් හේන් වගාවේ නිරත වන අතර, මේ නිසා පෝෂිත ප්‍රදේශ මෙන්ම වැව් ද විශාල තර්ජනයට ලක් වී ඇත. හේන් වගාව බිම් මාරු ක්‍රමයට සිදු වන අතර, එකම ඉඩමේ දීර්ඝ කාලයක් වගා කරන ගොවීන් ප්‍රමාණය ඉතා අඩුය. එසේම අලුතින් කැලෑ කපා හේන් වගාව සඳහා ඉඩම් එකතු කර ගැනීමද සිදුවේ. හේන් වගාව මෙම ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන බැවින් එය විධිමත්භාවයට පත් කිරීම හැර වෙනත් විකල්පයක් නොමැත.

## 3.7. එල්ලංගාව තුල දැනට සිදුකරමින් පවතින ඉදිකිරීම් (Constructions) කටයුතු පිලිබඳ තොරතුරු

එල්ලංගාව තුල පිහිටි පහල මත්තල වැව, පලුජදූර වැව, මුල්පිට වැව, ඔරුකෙම්ගල වැව, උඩ මත්තල වැව, ලුණුවැරණිය වැව, කුඩා නෙරළුගස්වැව, පළුගස් වැව සහ කොඩයන්බැදි වැව යන වැව් ලෝක බැංකු ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය මගින් …... වර්ෂයේ සිට පුනරුත්ථාපනය කරමින් පවතී. මේ සඳහා රුපියල් මිලියන …... ක් වෙන් කර ඇත. එල්ලංගාව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගැනෙන භූමි භාගයක පිහිටා ඇති බැවින් දැනට අලුතින් ඉදිකිරීම් කටයුතු සිදු නොවේ.

## 3.8. එල්ලංගා පද්ධතියේ කෘෂි කාර්මික බෝග වගා රටා (Cropping Patterns) පිලිබඳ තොරතුරු

මත්තල එල්ලංගාව පද්ධතිය තුල ඇති වැව් යටතේ හෙක්ටයාර් 365.83 ක් පමණ වගා කරන අතර, එම වැව් යටතේ කෘෂි කටයුතු වල යෙදෙන ගොවි පවුල් සංඛ්‍යාව 170 ක් පමණ වේ . මීට අමතරව හේන් වගා කරන ගොවීන් සංඛ්‍යාව …... ක් පමණ වේ. එල්ලංගාවේ ප්‍රධාන පාංශු කාණ්ඩය රතු දුඹුරු පස වන අතර ඊට අමතරව වැලි මිශ්‍ර ලොම් පස් හා බොරළු සහිත ගල් සහිත ප්‍රදේශයන් ද දැකිය හැක. මුළු පද්ධතියට අයත් භූමි ප්‍රමාණයෙන් 16.5% ක් පමණ වගා කටයුතු සඳහා යොදා ගෙන ඇති අතර 70.6% ක් පමණ කැලෑ හා ලඳු කැලෑ වේ.

එල්ලංගාවේ වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මි.මී. 1073 ක් වන අතර, පසුගිය වසර 10 ක වර්ෂාපතන රටාව සැලකූ විට යල කන්නයට අඩු වර්ෂාපතනයකුත් මහ කන්නයට සාපේක්ෂව වැඩි වර්ෂාපතනයක් ද බොහෝ ප්‍රදේශවලට ලැබී ඇත. එල්ලංගා පද්ධතිය තුල වගා කටයුතු සිදු කරනු ලබන ප්‍රධාන වැව් 09ක් ඇති අතර, එම වැව් යටතේ මහ කන්නයේ ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබුනු පසු වී වගාවන් කිරීමත්, ගොඩ ඉඩම් ප්‍රදේශවල හෙක්ටයාර් 213.56 පමණ හේන් වගාවත් සිදු කරනු

ලබයි. හේන් වල ප්‍රධාන වශයෙන් කුරක්කන්, මුං, කව්පි, රටකජු, තල වැනි බෝග වගා කරන අතර , මීට අමතරව මිරිස් හා එළවළු වර්ගද හේන් තුල වගා කරනු ලබයි. මහ කන්නය තුල වගා කරන භූමියෙන් 58.7% ක් පමණ හේන් වගා කරනු ලබන අතර 41.3% ක් පමණ වී වගාව කරනු ලබයි.

ජලය ප්‍රමාණවත් නොවීම නිසා යල කන්නයේදී එල්ලංගාවේ වැව් යටතේ වී වගාව කරනු ලබන බිම් ප්‍රමාණය අඩුවන අතර, එම කුඹුරු ඉඩම් වල මුං ඇට, රටකජු, කව්පි වැනි බෝග බහුල වශයෙන් වගා කෙරේ. එසේම ජල හිඟය නිසා මහ කන්නයේ පවා කුඹුරු ඉඩම් වල වගා කිරීමට නොහැකි වී ඇති අතර පසුගිය වසර 3 ක් බෝග වගා රටාව පහත වගු අංක 9 හි දක්වා ඇත.

*වගුව 9 - පසුගිය කන්න 5 තුල එල්ලංගාව තුල පිහිටි වැව් වල බෝග වගා රටාව*

| අනු අංකය | වැව | 2023 යල (හෙක්ටයාර) | | 2022/23 මහ (හෙක්ටයාර) | | 2022 යල (හෙක්ටයාර) | | 2021/22 මහ (හෙක්ටයාර) | | 2021 යල (හෙක්ටයාර) | | 2020/21 මහ (හෙක්ටයාර) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග | වී | අතිරේක බෝග |
| 1 | පහල මත්තල වැව | | | | | | | | | | | | |
| 2 | පළුජදූර වැව | | | | | | | | | | | | |
| 3 | මුල්පිට වැව | | | | | | | | | | | | |
| 4 | ඔරුකෙම්ගල වැව | | | | | | | | | | | | |
| 5 | උඩ මත්තල වැව | | | | | | | | | | | | |
| 6 | ලුණු වැරණිය වැව | | | | | | | | | | | | |
| 7 | කුඩා නෙරළුගස් වැව | | | | | | | | | | | | |
| 8 | පළුගස් වැව | | | | | | | | | | | | |
| 9 | කොඩයන්බැදි වැව | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | |

මූලාශ්‍රය - ගොවි සංවිධාන/යෝධකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය

ඉහත වගුව අනුව පසුගිය වසර 3 තුල සියලුම වැව් යටතේ මහ කන්නයේ වගා කර ඇත්තේ …... පමණි. එසේම යල කන්නයේ අතිරේක ආහාර බෝග වගාවක් සිදු කරන අතර අතිරේක බෝග වගාව ද මුලු වගා බිම් ප්‍රමාණයේම සිදු කර නැත. තවද වර්ෂාව ප්‍රමාණවත් නොවීම, මනා ජල කලමණාකරනයක් නොමැති වීම සහ එල්ලංගාවේ ජල පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවක් සිටීම නිසා සෑම කන්නයක්ම, අඛණ්ඩව වගා කිරීමට නොහැකි වී ඇත.

එසේ වුවද වාරිමාර්ග පුනරුත්ථාපනය, ජල කලමණාකරනය, දේශගුණ සුහුරු කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම හදුන්වාදීම සහ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම මගින් ඉහත බෝග වගා රටාව වෙනස් කිරීමට දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අපේක්ෂා කරන අතර යෝජිත බෝග වගා රටාව පහත වගු අංක 10 හි දැක්වේ.

*වගුව 10 - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් වැව් පුනරුත්ථාපනයෙන් පසු යෝජිත බෝග වගා රටාව*

| අනු අංකය | වැව | වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | යල කන්නයේ වගා කිරීමට යෝජිත බෝග වර්ග හා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | | | | | මහ කන්නයේදී වගා කිරීමට යෝජිත බෝග වර්ග හා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | මුං | මිරිස් | කව්පි | රටකජු | සෝයා | වී |
| 1 | පහල මත්තල වැව | | | | | | | |
| 2 | පළුජදුර වැව | | | | | | | |
| 3 | මුල්පිට වැව | | | | | | | |
| 4 | ඔරුකෙම්ගල වැව | | | | | | | |
| 5 | උඩ මත්තල වැව | | | | | | | |
| 6 | ලුණු වැරණිය වැව | | | | | | | |
| 7 | කුඩා නෙරළුගස් වැව | | | | | | | |
| 8 | පළුගස් වැව | | | | | | | |
| 9 | කොඩයන්බැදි වැව | | | | | | | |
| | එකතුව | | | | | | | |

මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සිදුකරන ලද ජල විද්‍යාත්මක තක්සේරු වාර්තාව

බෝග ජල අවශ්‍යතාවය පහත වගු 11හි දක්වා ඇති අතර, එය පදනම් කරගෙන වැවේ තිබෙන ජල ප්‍රමාණය අනුව වගා කරනු ලබන බෝග වර්ග තීරණය කල හැක.

වගුව 09 - බෝග ජල අවශ්‍යතාවය (අක්කර 1ක භූමි ප්‍රමාණයක් සඳහා)

| බෝගය | කන්න අනුව අක්කර 1 සඳහා සාමාන්‍ය ජල අවශ්‍යතාවය (මිලි.ලී) | |
|---|---|---|
| | යල | මහ |
| වී (මාස 3 ½) | 1250 | 910 |
| මිරිස් | 920 | 590 |
| රටකජු | 735 | 395 |
| බඩ ඉරිඟු | 825 | 460 |
| ලොකු ළූණු | 700 | - |
| මුං | 460 | 245 |
| කව්පි | 770 | 370 |
| සෝයා | 710 | 390 |

මූලාශ්‍රය - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## 3.9. එල්ලංගාවේ වාරිමාර්ග කළමණාකරනය (Irrigation Management) පිලිබඳ තොරතුරු

එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් 09 ක් යටතේ වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගා කරන අතර, ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාව සිදු කරනු ලබයි. මහ කන්නයේද අඛණ්ඩව වගාවන් සිදු නොවන අතර, සමහර වැව් වල කන්න ගණනාවක් මහ කන්නයේදී පවා වගා කර නොමැත. විශේෂයෙන්ම ලැබෙන ජලය සංවර්ධනය කර තිබෙන වැව් වල ප්‍රමාණයට ප්‍රමාණවත් නොවීම නිසා මහ කන්නයේද වගාව සිදු කිරීමට අපහසු වී ඇත.

දැනට එල්ලංගාවේ පිහිටි සෑම වැවකම ජලය බෙදා දීම මුර ක්‍රමය යටතේ සිදු කරනු ලබන අතර, ඒ අනුව එක් එක් ගොවියාට පැය කිහිපයක් පමණක් ජලය ලබාදේ. ජල පාලක විසින් අදාල පැය ගණන අවසන් වූ පසුව වගාවට ජලය ලබාදීම නතර කරනු ලබයි. ජල හිඟය නිසාම ජල පාලකගේ මැදිහත් වීම මත ජල කළමණාකරන කටයුතු සාර්ථකව සිදු කරනු ලබයි. එල්ලංගා පද්ධතියේ වැව් 09 ක් යටතේ ගොවි සංවිධාන …... ක් ඇති අතර, වගා කටයුතු අඛණ්ඩව සිදු නොකරන බැවින් ඒවායේ ක්‍රියාකාරීත්වයද දුර්වල වී ඇත. විශේෂයෙන්ම වගා කරන කන්න වල පමණක් ගොවි සංවිධාන ක්‍රියාත්මක වන අතර, බොහෝ ගොවි සංවිධාන නිලධාරීන්ට පමණක් සීමා වී ඇත.

විශේෂයෙන්ම සෑම වැවකම පාහේ අඛණ්ඩ නඩත්තුවක් සිදු නොවන අතර, වගා කරන කන්න වල පමණක් ඇළවල් සුද්ධ කරයි. මේ නිසා බොහෝ වැව් කණ්ඩි වල හා ඇළවල් වල විශාල ගස් වැවී

ඇත. ජලය බෙදා හැරීමේ ගැටළු විසඳීම සඳහා ගොවි සංවිධාන මැදිහත් වන අතර, මුර ක්‍රමය මත පැය ගණනකට ජලය ලබා දීම නිසා ජලය බෙදා හැරීම ආශ්‍රිත ගැටළු අඩුවී ඇත. ගොවීන් එල්ලංගාව තුල පදිංචි වී නොමැති නිසා ජලය අඩු වූ අවස්ථා වලදී බෙත්ම ක්‍රමයට වගාවක් සිදු නොවන අතර, මුං ඇට වැනි ජලය අඩුවෙන් අවශ්‍ය බෝග වර්ග පමණක් වගා කරයි. දැනට වැව් වල පස් ඇළ වල් තිබෙන බැවින් ජලය අපතේ යාම වැලැක්වීමට නොහැකි වී ඇති අතර, ජලය අවශ්‍ය පරිදි පාලනය කර බෙදා දීමටද නොහැකි වී ඇත. …... වැව් වල ජල පාලන නිර්මිත ඇත.

## 3.10. පෝෂක ප්‍රදේශයේ (Command Area) වර්තමාන තත්වය පිලිබඳ තොරතුරු

එල්ලංගාවේ වැව් යටතේ වගා කිරීම සඳහා සැලසුම් කර ඇති ඉඩම් ප්‍රමාණයට වඩා බොහෝ වැව් යටතේ වගා කර ඇති නමුදු, එය සමස්ථයක් ලෙස ගත් කල …... ක පමණ වැඩිවීමකි. එල්ලංගාවේ එක් එක් වැව යටතේ වගා කිරීමට සැලසුම් කර ඇති ඉඩම් ප්‍රමාණය සහ දැනට සංවර්ධනය කර ඇති ඉඩම් ප්‍රමාණය පහත වගු අංක 11යටතේ දැක්වේ.

*වගුව 11. එක් එක් වැව යටතේ සැලසුම් කරන ලද වගා ඉඩම් ප්‍රමාණය සහ දැනට වගා කරන ඉඩම් ප්‍රමාණය*

| වැව | සැලසුම් කරන ලද බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | දැනට වගා කරන බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
| --- | --- | --- |
| පහල මත්තල වැව | | |
| පළුජදුර වැව | | |
| මුල්පිට වැව | | |
| ඕරුකෙම්ගල වැව | | |
| උඩ මත්තල වැව | | |
| ලුණු වැරණිය වැව | | |
| කුඩා නෙරළුගස් වැව | | |
| පළුගස් වැව | | |
| කොඩයන්බැදි වැව | | |
| එකතුව | | |

මූලාශ්‍රය - ගොවි සංවිධාන / යෝධකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය

ජලය බෙදා හැරීමේ ඇල මාර්ග පස් වලින් සකස් කර ඇති බැවින්, ජලය ගලා යාමේ වේගය ඉතා අඩුවී ඇති අතර, අපතේ යාම ද වැඩි වී ඇත. විශේෂයෙන්ම වැව් වල වාරිමාර්ග ඇලවල් මෙන්ම නිර්මිත වලටද විශාල වශයෙන් හානි සිදු වී ඇත. එක් එක් වැව යටතේ ඇති ඇලවල්, ඒවායේ දිග සහ වගා බිම් ප්‍රමාණය පහත වගු අංක 12 හි දැක්වේ.

*වගුව 12 - ජලය බෙදා හැරීමේ ඇලවල් හා වගාබිම් ප්‍රමාණයන්*

| අනු අංක | වැව | ඇල | දිග (මීටර්) | වගා බිම් ප්‍රමාණය (අක්කර) |
|---|---|---|---|---|
| 1 | පහල මත්තල වැව | | | |
| 2 | පළුජදුර වැව | | | |
| 3 | මුල්පිට වැව | | | |
| 4 | ඔරුකෙම්ගල වැව | | | |
| 5 | උඩ මත්තල වැව | | | |
| 6 | ලුණු වැරණිය වැව | | | |
| 7 | කුඩා නෙරළුගස් වැව | | | |
| 8 | පළුගස් වැව | | | |
| 9 | කොඩයන්බැදි වැව | | | |
| | එකතුව | | | |

මූලාශ්‍රය - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ඉංජිනේරු සමීක්ෂණය (2022)

අපවහන ඇළවල් නිසියාකාරව නඩත්තු නොකිරීම සහ බොහෝ අපවහන ඇලවල් ගොවීන් විසින් අල්ලා ගැනීම නිසා, නියමිත පරිදි අපවහන ජලය බැස නොයෑම නිසා සමහර කුඹුරු ඉඩම් වල ලවණතාවය ඉහල ගොස් ඇත.

## 04. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

මත්තල එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග පහත දැක්වේ. ( I ) හේන් වගාව නිසා පාංශු ඛාදනය සහ වැව් වල රොන්මඩ තැන්පත් වීම (ii) ජල පෝෂක ප්‍රදේශ වල සහ ජලධාරා ප්‍රදේශයේ සිදුකරන හෙක්ටයාර් 213.56ක් පමණ වන අනවසර හේන් වගාව වර්ධනය විම (iii) කට්ටකඩුව, ගස් ගොම්මන ආදී සාම්ප්‍රදායික වාරි පරිසර පද්ධති විනාශ වීම (iv) හේන් වගාව සඳහා කැලෑ කැපීම නිසා වන ගහනය අඩු වීම (v) එල්ලංගාව තුල ගවයින් ......ක් පමණ නිදැල්ලේ ඇති කිරීම සහ ගවගාල් …... ක් පමණ වැව් පිටිවල ඉදිකර තිබීම නිසා වැව් කණ්ඩි සහ ඇල ඉවුරු වලට හානි සිදුවීම, වැව්වල රොන්මඩ තැන්පත් වීම හා විශේෂයෙන්ම උඩ මත්තල වැවෙහි ජලජ ශාක(ජපන් ජබර) වර්ධනය වීම (vi) වැව්, වාරි ඇල මාර්ග සහ නිර්මිත මනාව නඩත්තු නොකිරීම (vii) ජල කළමණාකරනය කිරීම සහ වාරි පද්ධති නඩත්තු කිරීම සඳහා පිහිටුවා ඇති ගොවි සංවිධාන අපේක්ෂිත මට්ටමින් ක්‍රියාකාරී


නොවීම (viii) වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ වීම (ix ) අපවහන ඇලවල් නිසිලෙස නඩත්තු නොකිරීම නිසා කුඹුරු වල ලවණතාවය ඉහල යාම (වර්තමානයේ හෙක්ටයාර් ...... ක් පමණ ලවණතාවයට ලක්වී ඇත) (x) එල්ලංගාවේ සෑම වැවකටම වාගේ වැව් රක්ෂිත නොමැති නිසා වැව් වල රොන්මඩ තැන්පත් වීම ඉහල යාම (xi) වර්ෂාව ප්‍රමාණවත් තරම් නොලැබීම හේතුවෙන් උඩ මත්තල වැව, ලුණුවැරණිය වැව, ඔරුකෙම්ගල වැව සහ පළුගස් වැවෙහිඇති වී ඇති උග්‍ර ජල හිඟය නිසා වැව් යටතේ යල මහ වගාකිරීමට නොහැකි වීම (xii) එල්ලංගා පද්ධතිය තුල පිහිටි ගම්වල ජීවත් වන්නන් හට පානීය ජලය නොමැති වීම (xiii) ලවණතාවය හේතුවෙන් වගාවන් කල නොහැකි වීම

## 4.1. එල්ලංගාවේ උග්‍ර ගැටළු (Critical Issues)

මත්තල එල්ලංගා පද්ධතිය තුල පවත්නා උග්‍ර ගැටළු පහත වගු අංක 13මගින් සංක්ෂිප්තව දක්වා ඇති අතර, ඒවයෙහි ස්ථානගත පිහිටීම පහත සිතියම 5 මගින් ද දක්වා ඇත.

එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා කඩිනමින් අවධානය යොමු කල යුතු යැයි තීරණය කරන ලද මැදිහත්වීම ඇතුලත් ගැටළු, උග්‍ර ගැටළු ලෙස හඳුනා ගන්නා ලදී. ඒවා එල්ලංගාවේ ප්‍රධාන අභියෝග අතුරින් සහ එල්ලංගා පැතිකඩේ සඳහන් දත්ත හා තොරතුරු ආශ්‍රයන් හඳුනාගන්නා ලදී. සැලසුම්කරුවන් ගැටළු ගස (Problem Tree) නැමැති සහභාගීත්ව ක්‍රමවේදය භාවිතා කර ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ එකතු වී සහභාගීත්ව හා තාත්වික ආකාරයට උග්‍ර ගැටළු හඳුනා ගන්නා ලදී.

සිතියම 5-මත්තල එල්ලංගා පද්ධතියට අයත් ප්‍රදේශයෙහි දක්නට ලැබෙන ප්‍රධාන ගැටළු



**මූලාශ්‍රය - හරස්කඩ චාරිකාව ඇසුරින් ලබා ගත් තොරතුරු**

*වගුව 13 - එල්ලංගාවේ උග්‍ර ගැටළු*

| අනු අංකය | උග්‍ර ගැටළුව | උග්‍ර ගැටළුවේ විෂය ක්ෂේත්‍රය |
|---|---|---|
| 1 | ප්‍රදේශයේ ගොවි පවුල් 170 ක් පමණ හෙක්ටයාර් 365.83 ක් පමණ වූ තම කෘෂි භූමි ජල හිඟය නිසාවෙන් දෙකන්නයේම ප්‍රමාණවත්ව වගා කිරීමට නොහැකිව ජල දරිද්‍රතාවයට (Water Poverty) ලක්වීමේ අවදානමට පත්වෙමින් සිටීම. විශේෂයෙන්ම උඩමත්තල වැව, ලුණු වැරණිය වැව, පළුගස් වැව සහ ඕරුකෙම්ගල වැවෙහි වගා කටයුතු සඳහා ප්‍රමාණවත්තරම් ජලය නොමැත. | කෘෂි ජල හිඟය |
| 2 | ස්වාභාවික ජලමාර්ග අවහිර කොට අනවසරයෙන් පතස් තනා එමගින් නව ජල මාර්ග ඔස්සේ වගා බිම් වලට ජලය ලබා ගැනීම හේතුවෙන් එල්ලංගාවේ විධිමත් වැව් පද්ධතියට ජලය ලැබීම අඩු වීම. | ස්වාභාවික ජල මාර්ග අනවසරයෙන් අවහිර කිරීම |
| 3 | නිදැල්ලේ හැසිරෙන ගවයින් සහ වැව් පිටිවල තනා ඇති ගවගාල් හි ඇති කරන …... ක් පමණ වූ ගවයින්ගෙන් වැව් ඉවුරු වලට සහ ඇළ මාර්ග වලට බරපතල හානි සිදුවීම මෙන්ම එල්ලංගාව දැඩි පාංශු ඛාදනයට ලක්වෙමින් පැවතීම. විශේෂයෙන්ම උඩ මත්තල වැව ආශ්‍රිතව ගව ගාල් විශාල ප්‍රමාණයක් ඇත. | පාංශු ඛාදනය |
| 4 | අවිධිමත් හේන් වගාව සහ ගව අපද්‍රව්‍ය ජලය සමඟ මිශ්‍රව වැව් පද්ධතියට එකතු වීම තුල වැව් රොන්මඩ වලින් පිරී යෑම සහ වැව් තුල ජලජ ශාඛ සීඝ්‍ර ලෙස බෝවීම. | රොන්මඩ පිරීම |
| 5 | පුරාණ වැව් පද්ධතියේ කට්ටකඩුව, ගස් ගොම්මන, ඉස්වැටිය, තිස්බඹය සහ අපවහන ඇළ මාර්ග විනාශ වීම තුල දැනටමත් එල්ලංගාවේ හෙක්ටයාර ……. ක් ලවණතාවයට බඳුන් වී තිබීම සහ එය තවදුරටත් ව්‍යාප්ත වෙමින් පැවතීම. | ලවණතාවය |
| 6 | හෙක්ටයාර් 213.56 කට ආසන්න භූමි ප්‍රදේශයක අනවසර සහ අවිධිමත් සිදු කෙරෙන හේන් වගාව සහ අලුතින් හේන් සඳහා කැලෑ එළිපෙහෙලි කිරීමත් තුල සිදුවන සීඝ්‍ර වන විනාශය. | වන විනාශය |
| 7 | නෛතිකව බලය සහ වගකීම පවරා ඇති පවතින ආයතනික ව්‍යුහයේ අකාරයක්ෂමතාවය නිසා එල්ලංගාව සහ එහි වැව් පද්ධතිය තුල ක්‍රමවත් ජල කළමණාකරන වැඩ පිළිවෙලක් නොමැති වීම සහ වාරි පද්ධතිය නිසි ලෙස නඩත්තු කිරීමක් සිදු නොකිරීම.<br>1.මුල්පිට වැව ගොඩ වී ඇත.<br>2.උඩ මත්තල වැවෙහි culvert 01 ප්‍රමාණවත් නොවීම.<br>3.උඩ මත්තල වැවෙහි spill trail channel 01 හි bund 01 ක් නොමැති වීම. | දුර්වල ජල කළමණාකරනය සහ නඩත්තුව |
| 8 | එල්ලංගාව තුල නොයෙක් මිනිස් ක්‍රියාකාරකම් නිසා වන සතුන්ගේ | අලි මිනිස් ගැටුම |

| | | |
|---|---|---|
| | නිදහස් වරණයට බාධා ඇති වීමත් නිසා වන සතුන් ගම් වැදීම සහ විශේෂයෙන්ම අලි මිනිස් ගැටුම උග්‍ර වෙමින් පැවතීම. | |
| 9 | ප්‍රතිපත්ති සම්පාදකයින්, පාර්ශවකාර සංවිධාන සහ ප්‍රතිලාභී ප්‍රජාව තුල එල්ලංගාව සුරැකීම සහ එහි තිරසරභාවය පවත්වා ගැනීමේ වැදගත්කම පිලිබඳව ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම නිසාවෙන් එයට අවම ප්‍රමුඛතාවයක් ලැබී තිබීම. | දැනුවත් භාවයේ මදකම |

## 4.2. එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ පරමාර්ථ සහ අරමුණු

4.2.1. පරමාර්ථය

මත්තල සරුසාර සහ තිරසාර එල්ලංගා පද්ධතියක් බවට පත් කිරීම සඳහා සියළු පාර්ශවකරුවන් විධිමත් සැලැස්මක් ඔස්සේ සඵලදායීව සහ සාමූහිකව ක්‍රියා කිරීම

4.2.2. අරමුණු (මේවා උග්‍ර ගැටළු විසඳීම හා පරමාර්ථ සාදනය සඳහා යොදාගනු ලබන උපාය මාර්ගික මැදිහත්වීම් වල අරමුණු ලෙස සැලකේ)

1. ගොවි ජල හිඟය අවම කිරීම සහ දේශගුණ සුහුරු කෘෂි භාවිතයන්ට ගොවි ජනතාව යොමු කරවීමට දායක වීම.
2. ජලධාරා ප්‍රදේශයට සහ ස්වාභාවික ජලමාර්ග වලට වන අවහිරය වලකාලීමට දායක වීම.
3. වැව් සහ ඇළවේලි පද්ධතිය ගව හානි වලින් ආරක්ෂා කිරීමට දායක වීම.
4. පාංශු ඛාදනය සහ වැව් තුල රොන්මඩ තැන්පත් වීම අවම කිරීමට දායක වීම.
5. එල්ලංගා භූමි ප්‍රදේශය ලවණතාවයට පත්වීමේ අවදානම අවම කිරීමට දායක වීම
6. ජල පෝෂක හා ජලධාරා ප්‍රදේශ වල සිදුවන වන විනාශය නවතාලීමට දායක වීම.
7. එල්ලංගාව තුල සිදුවන පරිසර දූෂණය අවම කිරීමට දායක වීම.
8. එල්ලංගාව සහ වැව් පද්ධතියේ ජල කළමණාකරනය සඳහා පවතින ආයතන ව්‍යුහය ශක්තිමත් කිරීම.
9. අලි මිනිස් ගැටුම අවම කිරීමට දායක වීම
10. දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් එල්ලංගාව සුරැකීම සඳහා පාර්ශවකරුවන් සහ ප්‍රතිලාභීන් සජීවීකරණය කිරීම.

## 4.3. එල්ලංගා කළමණාකරන කමිටුව විසින් උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්

උග්‍ර ගැටළු යනු ප්‍රතිපත්ති සම්පාදකයන්, එල්ලංගා කළමණාකරන කමිටුව, පාර්ශවකාර ආයතන කඩිනමින් අවධානය යොමු කර මැදිහත් වීම් සිදුකර විසඳාගත යුතු හෝ අවම කර ගත යුතු ගැටළු වේ. උපායමාර්ගික මැදිහත් වීම් ක්‍රියාත්මක කිරීම හරහා උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම කල හැක. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය හා ප්‍රජා මූල සංවිධාන සහයෝගයෙන් ශිල්පීය

මැදිහත් විම් ඇතුලත් වඩාත් සුදුසු ක්‍රියාකාරකම් හරහා තාත්විකව සංවර්ධන කල ක්‍රියාත්මක සැලැස්මක් හරහා උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම කල හැක. ඒවා පහත වගු අංක14 හි දක්වා ඇත.

*වගුව 14 - අරමුණු සාධනය සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්*

| **අනු අංකය** | **අරමුණ** | **ප්‍රධාන ක්‍රියාකාරකම්** |
|---|---|---|
| 1 | ගොවි ජල හිඟය අවම කිරීම සහ දේශගුණ සුහුරු වාරි කෘෂි භාවිතයන්ට ගොවි ජනතාව යොමු කරවීමට දායක වීම. | 1.1 කුඹුරු වල පවත්නා පතස් පුළුල් කොට ප්‍රදේශයේ භූගත ජල මට්ටම සංතෘප්ත මට්ටමින් තබා ගැනීම හා වගාව සඳහා ජලය ලබා ගැනීම. |
| | | 1.2 දේශගුණ සුහුරු ගොවි භාවිතාවන්, නවීන මෙන්ම වැඩි දියුණු කල කෘෂි කාර්මික ක්‍රම ගොවි සංවිධාන හරහා හඳුන්වා දීම හා යල කන්නයේ කුඹුරුවල අතිරේක බෝග වගාව ව්‍යාප්ත කිරීම. |
| | | 1.3 එල්ලංගා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතු සඳහා වාර්ෂික කෘෂිකර්ම සැලැස්මක් සැකසීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්වය නියාමනය කිරීම. |
| | | 1.4 ලැබෙන ජලය එල්ලංගාවේ සියලුම ජල ජල පාර්භෝගිකයින් අතර බෙදා දීමේ අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කිරීම. |
| | | 1.5 ගොවි නිෂ්පාදන සඳහා ඉහල මිලක් සපයා ගැනීම පිණිස රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ ගනුදෙනු කිරීමට නිෂ්පාදන සමිති හා නිෂ්පාදන සංගම් ශක්තිමත් කිරීම, පසු අස්වනු තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම, වගාකරුවන් හා මිලදීගන්නන් අතර |

| | | |
|---|---|---|
| | | සබඳතාවය ගොඩනැගීම හා පසු විපරම. |
| 2 | ජලධාරා ප්‍රදේශයට සහ ස්වාභාවික ජලමාර්ග වලට වන අවහිරය වලකාලීමට දායක වීම.<br>1.අලි පැන්නුම සඳහා සකස් කරන ලද මාර්ග නිසා ජල මාර්ග හරස් වීම<br>2.කුඩා නෙරළුගස් වැවට ගංඉම කන්ද සිට ජලය පැමිණෙන ආර හරස් වන සේ වගා කර ඇති හේන් | 2.1 ජල මාර්ග අවහිර කිරීම පිලිබඳව සමීක්ෂණයක් පවත්වා පවත්නා වැව් හඳුනා ගැනීම සහ නීතිමය පියවර ගැනීම. |
| 3 | වැව් සහ ඇළවේලි පද්ධතිය ගව හානි වලින් ආරක්ෂා කිරීමට දායක වීම. | 3.1 එල්ලංගාව තුල නිදැල්ලේ ගවයින් ඇති කිරීම නිසා වාරි පද්ධතියට වන හානිය සහ ගුණාත්මයෙන් ඉහල ගවයින් ඇති කිරීම තුලින් ලබා ගත හැකි වාසි පිලිබඳව ගව හිමියන් දැනුවත් කිරීම. |
| | | 3.2 නිදැල්ලේ ගවයින් ඇති කිරීම වෙනුවට සූක්ෂම ගව පාලනය සඳහා ගව හිමියන් යොමු කිරීම. |
| 4 | පාංශු බාදනය සහ වැව් තුල රොන්මඩ තැන්පත් වීම අවම කිරීමට දායක වීම.<br>1.මුල්පිට වැව සම්පුර්ණයෙන්ම ගොඩ වී ඇත. | 4.1 එල්ලංගාව තුල පරිසරයට වඩාත් සංවේදී ප්‍රදේශ වලසිදු කරනු ලබන හේන් වගාවේදී පස් සෝදා යාම වැලැක්වීම සඳහා පාංශු සංරක්ෂණ වැටි යෙදීමට හේන් වගා ගොවීන් උනන්දු කරවීම හා ඔවුන් අතර දේශගුණ සුහුරු කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. |
| | | 4.2 එල්ලංගාවේ ඇති සෑම වැවකම රක්ෂිත මායිම් ලකුණු කොට රක්ෂිත සීමාවේ සිට මීටර් 20 ක වත් ප්‍රේරණ කලාපයක් ඇති කොට එම ප්‍රේරණ කලාපයේ වන වගා කිරීම. |
| | | 4.3 වැව් තුල ඇති ගවගාල් වලින් වැවට වන හානිය පිලිබඳව ගව හිමියන් දැනුවත් කර ඒවා කඩිනමින් ඉවත් කිරීම. |
| 5 | එල්ලංගා භූමි ප්‍රදේශය ලවණතාවයට පත්වීමේ අවදානම අවම කිරීමට දායක වීම | 5.1 පුරාණ වාරි පද්ධතියේ පැවැති කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන, තිස්බඹය, එල්ලංගාවේ සෑම වැවකම නැවත |

| | | |
|---|---|---|
| | | ප්‍රතිෂ්ඨාපනය කිරීම, අපවහන ඇල වල් මනාව නඩත්තු කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධාන වල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. |
| 6 | ජල පෝෂක හා ජලධාරා ප්‍රදේශ වල සිදුවන වන විනාශය නවතාලීමට දායක වීම. | 6.1 අලුතින් හේන් වගා කිරීම සඳහා කැලෑ කැපීම සම්පූර්ණයෙන්ම නැවත්වීම සඳහා කටයුතු කිරීම. |
| 7 | එල්ලංගාව තුල සිදුවන පරිසර දූෂණය අවම කිරීමට දායක වීම. | 7.1 එල්ලංගාවට කසළ බැහැර කරන සියලු දෙනා එහි ආදීනව පිළිබඳ දැනුවත් කිරීම. |
| **8** | එල්ලංගාව සහ වැව් පද්ධතියේ ජල කළමණාකරනය සඳහා පවතින ආයතන ව්‍යුහය ශක්තිමත් කිරීම. | 8.1 එල්ලංගාව තුළ පිහිටි ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් වැත්වීම හා ගොවි සංවිධාන වල කාන්තා සහභාගීත්වය ඉහල නැංවීම සඳහා කටයුතු කිරීම. |
| | | 8.2 උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම සඳහා දේශගුණික සුහුරු වගා ක්‍රම හඳුන්වා දීම හා ව්‍යාප්ත කිරීම. |
| | | 8.3 කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන ජලය මැනීම සඳහා සෑම වැවකම සෑම සොරොව්වක් සඳහාම ජල මාපක සවි කිරීම, ඒ අනුව ජල භාවිතය පිලිබඳ තොරතුරු එකතු කිරීම, ඒවා සමාජ ගත කිරීම, එම තොරතුරු මත ජලය බෙදා දීම සඳහා ගොවි සංවිධානය මෙහෙය වීම. |
| | | 8.4 ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිරන්තර හා අඛන්ඩව වැව් පද්ධතිය නඩත්තු කිරීමට සෑම ගොවි සංවිධානයක් සඳහාම තණ කොළ කපන යන්ත්‍රයක් ඇතුලු නඩත්තු උපකරණ කට්ටලයක් ලබා දීම. |
| | | 8.5 එල්ලංගා පද්ධතිය තුල පිහිටි සෑම වැවකම වැව් බැම්ම ඇළ මාර්ග, ජල අපවහන ඇලමාර්ග නිර්මිත හා එල්ලංගා පද්ධතිය තුල |

| | | |
|---|---|---|
| | | පිහිටි ස්වාභාවික ජලමාර්ග නඩත්තු කිරීම සඳහා නඩත්තු සැලැස්මක් සැකසීම හා අවසානයේ සමස්ථ එල්ලංගා පද්ධතියටම වාර්ෂික නඩත්තු සැලැස්මක් සැකසීම හා ඒ අනුව ඒවා නඩත්තු කිරීමට ගොවි සංවිධාන ඇතුළු අදාල පාර්ශව යොමු කරවීම. |
| | | 8.6 එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් වල ජලය බෙදා හැරීම, ගංවතුර අවස්ථාවකදී කටයුතු කල යුතු ආකාරය දැක්වෙන ස්ථාවර මෙහෙයුම් නියෝග (**Standard Operation Procedure – SOP)** සැකසීම හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පසුවිපරම් කිරීම. |
| | | 8.7 සෑම වගා කන්නයකදීම එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමක් පවත්වා පවතින ජල තත්වයන් හා ඉදිරියේදී ඇති විය හැකි වර්ෂාව සලකා බලා කන්නයේ වගා කටයුතු පිලිබඳ මූලික තීරණ ගැනීම. |
| | | 8.8 එල්ලංගා පද්ධතිය තුල ඉතාමත්ම අබලන්ව පවතින කෘෂි මාර්ග අලුත්වැඩියා කිරීම.<br>1. විශේෂයෙන්ම පළුගස් වැවට යන මාර්ගය අබලන් වී ඇත. |
| 9 | අලි මිනිස් ගැටුම අවම කිරීමට දායක වීම | විදුලි වැට නිරන්තරයෙන් නඩත්තු කිරීම. |
| 10 | පාර්ශවකරුවන් සහ ප්‍රතිලාභීන් එල්ලංගාව සුරැකීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් සජිවීකරණය කිරීම. | එල්ලාංගාව සුරකීම පිළිබදව පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් විදී නාට්‍ය, බැනර්, පොස්ටර්, රැස්වීම් හා විවිධ ක්‍රම මගින් දැනුවත් කිරීම. |

## 5. එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම

එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුවට එල්ලංගාව සහ ජල පෝෂක ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට මගපෙන්වයි. සහභාගීත්ව

ක්‍රමවේද යටතේ සියලු හවුල්කාර ආයතනවල මැදිහත් වීමෙන් එල්ලංගා පැතිකඩෙන් හඳුනාගත් උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සංවර්ධනය කර ඇත. හඳුනාගත් මැදිහත් වීම්, කාලවකවානු, යෝජිත මැදිහත්වීම්, ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන ඇතුලත් Gannt සටහනින් ඉහත කාර්යය පහසු වී ඇත. වගු අංක 14 හි මෙම සටහනට අනුපූර්වකයක් ලෙස එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මේ ඇතුලත් සෑම මැදිහත්වීමක් සඳහාම වැය වන දල වියදම සහ හවුල්කාර ආයතන, පෞද්ගලික අංශය සහ ප්‍රජා මූල සංවිධාන වලින් අපේක්ෂිත දායකත්වය හා ආධාර ලබාදෙන ආයතන වලින් අපේක්ෂිත මූල්‍ය දායකත්වය දක්වා ඇත. එසේම වගු අංක 15 හි දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මැදිහත් වීම් වල දල වියදම හා ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු දක්වා ඇත.

*වගුව 15 - එල්ලංගා පද්ධති කලමණාකරනය සඳහා ක්‍රියාකාරකම්, කාලරාමුව සහ වගකීම් සැලැස්ම (Gannt සටහන )*

| අනු අංකය | උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීමේ ප්‍රධාන ක්‍රියාකාරකම් | දළ පිරිවැය (රු. මි) | කාලරාමුව | | | | | | | | | | | | ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කෙටිකාලීන ඔක්තෝබර් - දෙසැම්බර් 2023 | | | | මධ්‍යකාලීන ජන - දෙසැ 2024 | | | | දිගුකාලීන ජන - දෙසැ 2025 | | | | | |
| | | | සැප් | ඔක් | නොවැ | දෙසැ | කා 1 | කා 2 | කා 3 | කා 4 | කා1 | කා 2 | කා 3 | කා 4 | ප්‍රධාන | අනෙකුත් |
| 1 | කුඹුරු වල පවත්නා පතස් පුළුල් කොට ප්‍රදේශයේ භූගත ජල මට්ටම සංතෘප්ත මට්ටමින් තබා ගැනීම හා වගාව සඳහා ජලය ලබා ගැනීම. | | | | | | | | | | | | | | දේශ ගුණ සුහුරු වාරි කෘෂි කර්ම ව්‍යා පෘති ය, පළා ත් වාරි මාර්ග දෙපා ර්ත මේ න්තුව | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන |
| | දේශගුණ සුහුරු ගොවි භාවිතාවන්, නවීන මෙන්ම වැඩි දියුණු කල කෘෂි කාර්මික ක්‍රම ගොවි | | | | | | | | | | | | | | දේශගු ණ සුහුරු වාරි කෘෂික ර්ම ව්‍යාපෘ | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංවිධාන හරහා හඳුන්වා දීම | | | | | | | | | | | | | | තියපළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | |
| | එල්ලංගා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතු සඳහා වාර්ෂික කෘෂිකර්ම සැලැස්මක් සැකසීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්වය පසුවිපරම් කිරීම. | | | | | | | | | | | | | | **දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය,පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | ලැබෙන ජලය එල්ලංගාවේ සියලුම ජල පාර්භෝගිකයින් අතර බෙදා දීමේ අවශ්‍යතාවය පිලිබඳව දැනුවත් කිරීම. | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | ගොවි නිෂ්පාදන සඳහා ඉහල මිලක් සපයා ගැනීම පිණිස රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමහ ගනුදෙනු කිරීමට | | | | | | | | | | | | | | **දේශගුණ සුහුරු වා** | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිෂ්පාදන සමිති හා නිෂ්පාදන සංගම් ශක්තිමත් කිරීම. | | | | | | | | | | | | | | **රි<br>කෘෂිකර්ම ව්‍යාපෘතිය පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | |
| 2 | ජල මාර්ග අවහිර කිරීම පිලිබඳව සමීක්ෂණයක් පවත්වා පවත්නා වැව් හඳුනා ගැනීම සහ නීතිමය පියවර ගැනීම. | | | | | | | | | | | | | | **දේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | ගොවි සංවිධාන |
| 3 | එල්ලංගාව තුල නිදැල්ලේ ගවයින් ඇති කිරීම නිසා වාරි පද්ධතියට වන හානිය සහ ගුණාත්මයෙන් ඉහල ගවයින් ඇති කිරීම තුලින් ලබා ගත හැකි වාසි පිලිබඳව ගව හිමියන් දැනුවත් කිරීම. | | | | | | | | | | | | | | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව , වන සංරක්ෂණ දෙපාර්ත | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | මේන්තුව | |
| | නිදැල්ලේ ගවයින් ඇති කිරීම වෙනුවට සූක්ෂම ගව පාලනය සඳහා ගව හිමියන් යොමු කිරීම. | | | | | | | | | | | | | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, | ගොවි සංවිධාන |
| 4 | එල්ලංගාව තුල පරිසරයට වඩාත් සංවේදී ප්‍රදේශ වලසිදු කරනු ලබන හේන් වගා බිම් වලින් පස් සෝදා යාම වැලැක්වීම සඳහා පාංශු සංරක්ෂණ වැටි යෙදීමට හේන් වගා ගොවීන් උනන්දු කරවීම හා ඔවුන් අතර දේශගුණ සුහුරු කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. | 5.00 | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ගොවි සංවිධාන |
| | එල්ලංගාවේ ඇති සෑම වැවකම රක්ෂිත මායිම් ලකුණු කොට රක්ෂිත සීමාවේ සිට මීටර් 20 ක වත් ප්‍රේරණ කලාපයක් ඇති කොට එම ප්‍රේරණ කලාපයේ වන වගා කිරීම. | 8.00 | | | | | | | | | | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන, |
| | වැව් තුල ඇති ගවගාල් වලින් | 0.05 | | | | | | | | | | | | වන සංරක්ෂ | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වැවට වන හානිය පිළිබඳව ගව හිමියන් දැනුවත් කර ඒවා කඩිනමින් ඉවත් කිරීම. | | | | | | | | | | | | | | ණ දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පරිසර පොලිසිය | |
| 5 | වැව් වල ලවණතාවයට ගොදුරු වී ඇති කුඹුරු ඉඩම් වල කිවුල් ඇල වල් ඉදිකිරීම. | 3.00 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගොවි සංවිධාන |
| | පුරාණ වාරි පද්ධතියේ පැවැති කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන, තිස්බඹය, එල්ලංගාවේ සෑම වැවකම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම, අපවහන ඇල වල් මනාව නඩත්තු කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධාන වල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | ලවණතාවයට ඔරොත්තු දෙන වී වර්ග හා කෘෂිකාර්මික වත් පිළිවෙත් භාවිතය ප්‍රචලිත කිරීම හා කෘෂිකාර්මික වත් පිළිවෙත් ප්‍රචලිත කිරීම. | 0.50 | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘති | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | ය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| 6 | අලුතින් හේන් වගාව සඳහා රක්ෂිත කැලෑ කැපීම සම්පූර්ණයෙන්ම නැවත්වීම සඳහා කටයුතු කිරීම. | 0.10 | | | | | | | | | | | | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | |
| 7 | දැනට එල්ලංගාව තුල පිහිටි කසළ බැහැර කරන ස්ථානයේ අපද්‍රව්‍ය පරිසරයට එකතු වීම වැලක්වීම | | | | | | | | | | | | | ප්‍රාදේශීය සභාව,වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන |
| | එල්ලංගාවට කසළ බැහැර කරන සියලු දෙනා එහි ආදිනව පිළිබද දැනුවත් කිරීම. | | | | | | | | | | | | | ප්‍රාදේශීය සභාව,වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ගොවි සංවිධාන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 8 | එල්ලංගාව තුළ පිහිටි ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක් පැවැත්වීම හා | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගොවි සංවිධාන වලට කාන්තා සහභාගීත්වය ඉහල නැංවීම සඳහා කටයුතු කිරීම. | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | |
| | උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම සඳහා දේශගුණික සුහුරු වගා ක්‍රම හඳුන්වා දීම හා ව්‍යාප්ත කිරීම | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව , පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | ජලය මැනීම සඳහා ජල මාපක සවි කිරීම, ඒ අනුව ජල භාවිතය පිලිබඳ තොරතුරු එකතු කිරීම, එම තොරතුරු මත ජලය බෙදා දීම සඳහා ගොවි සංවිධානය මෙහෙය වීම. | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව , පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිරන්තර හා අඛන්ඩව වැව් පද්ධතිය නඩත්තු කිරීම සඳහා සෑම ගොවි සංවිධානයකටම තණ කොළ කපන යන්ත්‍රයක් ඇතුලු නඩත්තු උපකරණ කට්ටලයක් ලබා දීම. | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව්, ඒවායේ ඇළ මාර්ග, නිර්මිත හා එල්ලංගා පද්ධතිය තුල ස්වාභාවික ජලමාර්ග නඩත්තු කිරීම සඳහා වාර්ෂික නඩත්තු සැලැස්මක් සැකසීම හා ඒ අනුව ඒවා නඩත්තු කිරීමට ගොවි සංවිධාන ඇතුලු අදාල පාර්ශව යොමු කරවීම. | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් වල ජලය බෙදා හැරීම, ගංවතුර අවස්ථාවකදී කටයුතු කල යුතු ආකාරය දැක්වෙන ස්ථාවර මෙහෙයුම් නියෝග **(Standard Operation Procedure – SOP)** සැකසීම හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පසුවිපරම් කිරීම. | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| | සෑම වගා කන්නයකදීම එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමක් පවත්වා පවතින ජල තත්වයන් හා ඉදිරියේදී ඇති විය හැකි වර්ෂාව සලකා බලා කන්නයේ වගා කටයුතු පිලිබඳ මූලික | | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | තීරණ ගැනීම | | | | | | | | | | | | | | | |
| | එල්ලංගා පද්ධතිය තුල ඉතාමත්ම අබලන්ව පවතින කෘෂි මාර්ග අලුත්වැඩියා කිරීම. | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| 9 | පවතින අලිවැට විධිමත්ව නඩත්තු කොට පවත්වා ගෙන යාම | | | | | | | | | | | | | | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 10 | 1. එල්ලාංගාව සුරකීම පිළිබඳව පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් විදී නාට්‍ය, බැනර්, පොස්ටර්, රැස්වීම් මගින් දැනුවත් කිරීම. | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | එකතුව | | | | | | | | | | | | | | | |

## 5.2. යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්, වැය වන මුදල සහ පාර්ශවකරුවන්ගෙන් අපේක්ෂිත දල මූල්‍ය දායකත්වය

යෝජිත මැදිහත්වීම් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වැය වන මුදල සහ පාර්ශවකරුවන්ගෙන් අපේක්ෂිත දායකත්වය පහත වගු අංක 16 මගින් දැක්වේ.

*වගුව 16 - ඇස්තමේන්තුගත වියදම*

| අං | යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් | ආසන්න වියදම (රු. වලින් ) |
|---|---|---|

| ක ය | | මුලු දල වියදම (රු. මි) | පෞද්ගලික අංශයේ දායකත්වය (රු. මි) | පාර්ශවකාර ආයතන වල දායකත්වය (රු.මි) | ප්‍රජා දායක ත්වය (රු.මි) | ආධාර සපයන ආයතන වලින් අපේක්ෂිත මුදල (රු.මි) |
|---|---|---|---|---|---|---|
| 1 | කුඹුරු වල පවත්නා පතස් පුළුල් කොට ප්‍රදේශයේ භූගත ජල මට්ටම සංතෘප්ත මට්ටමින් තබා ගැනීම හා වගාව සඳහා ජලය ලබා ගැනීම. | | | | | |
| 2 | දේශගුණ සුහුරු ගොවි භාවිතාවන්, නවීන මෙන්ම වැඩි දියුණු කල කෘෂි කාර්මික ක්‍රම ගොවි සංවිධාන හරහා හඳුන්වා දීම හා යල කන්නයේ කුඹුරු වල අතිරේක බෝග වගාව ව්‍යාප්ත කිරීම. | | | | | |
| 3 | එල්ලංගා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතු සඳහා වාර්ෂික කෘෂිකර්ම සැලැස්මක් සැකසීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්වය නියාමනය කිරීම. | | | | | |
| 4 | ලැබෙන ජලය එල්ලංගාවේ සියලුම ජල පාර්භෝගිකයින් අතර බෙදා දීමේ අවශ්‍යතාවය පිලිබඳව දැනුවත් කිරීම. | | | | | |
| 5 | ගොවි නිෂ්පාදන සඳහා ඉහල මිලක් සපයා ගැනීම පිණිස රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ ගනුදෙනු කිරීමට නිෂ්පාදන සමිති හා නිෂ්පාදන සංගම් ශක්තිමත් කිරීම, පසු අස්වනු තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම, වගාකරුවන් හා මිලදීගන්නන් අතර සබඳතාවය ගොඩනැගීම හා පසු විපරම. | | | | | |
| 6 | ජල මාර්ග අවහිර කිරීම පිලිබඳව සමීක්ෂණයක් පවත්වා නීතිමය පියවර ගැනීම. | | | | | |
| 7 | එල්ලංගාව තුල නිදැල්ලේ ගවයින් | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ඇති කිරීම නිසා වාරි පද්ධතියට වන හානිය සහ ගුණාත්මයෙන් ඉහල ගවයින් ඇති කිරීම තුලින් ලබා ගත හැකි වාසි පිලිබඳව ගව හිමියන් දැනුවත් කිරීම. | | | | | |
| 8 | නිදැල්ලේ ගවයින් ඇති කිරීම වෙනුවට සූක්ෂම ගව පාලනය සඳහා ගොවීන් යොමු කිරීම. | | | | | |
| 9 | එල්ලංගාව තුල පරිසරයට වඩාත් සංවේදී ප්‍රදේශ වලසිදු කරනු ලබන හේන් වගාවේදී පස් සෝදා යාම වැලැක්වීම සඳහා පාංශු සංරක්ෂණ වැටි යෙදීමට හේන් වගා ගොවීන් උනන්දු කරවීම හා ඔවුන් අතර දේශගුණ සුහුරු කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. | | | | | |
| 10 | එල්ලංගාවේ ඇති සෑම වැවකම රක්ෂිත මායිම් ලකුණු කොට රක්ෂිත සීමාවේ සිට මීටර් 20 ක වත් ප්‍රේරණ කලාපයක් ඇති කොට එම ප්‍රේරණ කලාපයේ වන වගා කිරීම. | | | | | |
| 11 | වැව් තුල ඇති ගවගාල් වලින් වැවට වන හානිය පිලිබඳව ගව හිමියන් දැනුවත් කර කඩිනමින් ඉවත් කිරීම. | | | | | |
| 12 | වැව් වල ලවණතාවයට ගොදුරු වී ඇති කුඹුරු ඉඩම් වල කිවුල් ඇල වල් පමණ ඉදිකිරීම. | | | | | |
| 13 | පුරාණ වාරි පද්ධතියේ පැවැති කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන, තිස්බඹය, අපවහන ඇලවල්, එල්ලංගාවේ සෑම වැවකම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධාන වල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. | | | | | |
| 14 | ලවණතාවයට ඔරොත්තු දෙන වී | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වර්ග භාවිතය ප්‍රචලිත කිරීම හා කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. | | | | | |
| 15 | අලුතින් ඟේන් වගා කිරීම සඳහා කැලෑ කැපීම සම්පූර්ණයෙන්ම නැවත්වීම සඳහා කටයුතු කිරීම. | | | | | |
| 16 | දැනට එල්ලංගාව තුළ පිහිටි කසළ බැහැර කරන ස්ථානයේ ඇති අපද්‍රව්‍ය පරිසරයට එකතු වීම වැලක්විම. | | | | | |
| 17 | කසල අංගනයේ පැල සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | | | | | |
| 18 | එල්ලංගාවට කසළ බැහැර කරන සියලු දෙනා එහි ආදිනව පිළිබද දැනුවත් කිරීම. | | | | | |
| 19 | එල්ලංගාව තුළ පිහිටි ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා ගොවි සංවිධාන වල කාන්තා සහභාගීත්වය ඉහල නැංවීම සඳහා කටයුතු කිරීම. | | | | | |
| 20 | උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම සඳහා දේශගුණික සුහුරු වගා ක්‍රම හඳුන්වා දීම හා ව්‍යාප්ත කිරීම. | | | | | |
| 21 | ජලය මැනීම සඳහා ජල මාපක සවි කිරිම, ඒ අනුව ජල භාවිතය පිලිබඳ තොරතුරු එකතු කිරීම, ඒවා සමාජගත කිරීම, එම තොරතුරු මත ජලය බෙදා දීම සඳහා ගොවි සංවිධානය මෙහෙය වීම. | | | | | |
| 22 | ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිරන්තර හා අඛන්ඩව වැව් පද්ධතිය නඩත්තු කිරීමට සෑම ගොවි සංවිධානයක් සඳහාම තණ කොළ කපන යන්ත්‍රයක් ඇතුලු නඩත්තු උපකරණ කට්ටලයක් ලබා දීම. | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23 | එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව්, ඒවායේ ඇළ මාර්ග, නිර්මිත හා එල්ලංගා පද්ධතිය තුල ස්වාභාවික ජලමාර්ග නඩත්තු කිරීම සඳහා වාර්ෂික නඩත්තු සැලැස්මක් සැකසීම හා ඒ අනුව ඒවා නඩත්තු කිරීමට ගොවි සංවිධාන ඇතුලු අදාල පාර්ශව යොමු කරවීම. | | | | | |
| 24 | එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් වල ජලය බෙදා හැරීම, ගංවතුර අවස්ථාවකදී කටයුතු කල යුතු ආකාරය දැක්වෙන ස්ථාවර මෙහෙයුම් නියෝග (Standard Operation Procedure – SOP) සැකසීම හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පසුවිපරම් කිරීම. | | | | | |
| 25 | සෑම වගා කන්නයකදීම එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමක් පවත්වා පවතින ජල තත්වයන් හා ඉදිරියේදී ඇති විය හැකි වර්ෂාව සලකා බලා කන්නයේ වගා කටයුතු පිලිබඳ මූලික තීරණ ගැනීම. | | | | | |
| 26 | එල්ලංගා පද්ධතිය තුල ඉතාමත්ම අබලන්ව පවතින කෘෂි මාර්ග අලුත්වැඩියා කිරීම. | | | | | |
| 27 | දැනට එල්ලංගාව තුල පිහිටි විදුලි වැට විධිමත්ව නඩත්තු කොට පවත්වා ගෙන යාම. | | | | | |
| 28 | එල්ලාංගාව සුරකීම පිළිබදව පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් විදී නාට්‍ය, බැනර්, පොස්ටර්, රැස්වීම් මගින් දැනුවත් කිරීම. | | | | | |
| | **එකතුව** | | | | | |

## 5.3. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය තුල එමගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන ක්‍රියාකාරකම්

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය එහි ව්‍යාපෘති කාලය තුල මත්තල එල්ලංගා කළමණාකරන සැලැස්මේ ඇතුලත් උපාය මාර්ගික මැදිහත්වීම් වලට මූල්‍ය අනුග්‍රහය ලබාදීමට අදහස් කර ඇත. තවද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්යය මණ්ඩලය හරහා හඳුනාගත් මැදිහත්වීම් සඳහා උප ව්‍යාපෘති වාර්තා සකස් කිරීමටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහාය ලබාදෙනු ඇත. එසේම යෝජිත මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින පාර්ශවකාර ආයතන එල්ලංගා කළමණාකරන කමිටුව සමඟ සබඳතාවයකින් යුක්තව කටයුතු කල යුතුවේ. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් තෝරාගත් මැදිහත්වීම් වල ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ දල වියදම් ඇස්තමේන්තුව සහ කාලරාමුව පහත වගු අංක 17 හි දැක්වේ.

*වගුව 17 - උපායමාර්ගික මැදිහත්වීම් වල ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවා ක්‍රියාත්මක කාල රාමුව*

| අනු අංක | යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් | ආසන්න වියදම් (රු.) | 2024 | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි |
| 1 | කුඹුරු වල පවත්නා පතස් (පුළුල් කොට ප්‍රදේශයේ භූගත ජල මට්ටම සංතෘප්ත මට්ටමින් තබා ගැනීම හා වගාව සඳහා ජලය ලබා ගැනීම. | | | | | | |
| 2 | දේශගුණ සුහුරු ගොවි භාවිතාවන්, නවීන මෙන්ම වැඩි දියුණු කල කෘෂි කාර්මික ක්‍රම ගොවි සංවිධාන හරහා හඳුන්වා දීම හා යල කන්නයේ කුඹුරු වල අතිරේක බෝග වගාව ව්‍යාප්ත කිරීම. | | | | | | |
| 3 | එල්ලංගා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතු සඳහා වාර්ෂික කෘෂිකර්ම සැලැස්මක් සැකසීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්වය පසුවිපරම් කිරීම. | | | | | | |
| 4 | එල්ලංගාව තුල පරිසරයට වඩාත් සංවේදී ප්‍රදේශ වල සිදු කරනු ලබන හේන් වගාවේදී පස් සෝදා යාම වැලැක්වීම | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | සඳහා පාංශු සංරක්ෂණ වැටි යෙදීමට හේන් වගා ගොවීන් උනන්දු කරවීම හා ඔවුන් අතර දේශගුණ සුහුරු කෘෂිකාර්මික වත් පිලිවෙත් ප්‍රචලිත කිරීම. | | | | | | |
| 5 | ලවණතාවයට ඔරොත්තු දෙන වී වර්ග හා කෘෂිකාර්මිකවත් පිලිවෙත් භාවිතය ප්‍රචලිත කිරීම. | | | | | | |
| 6 | පුරාණ වාරි පද්ධතියේ පැවැති කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන, තිස්බඔය, අපවහන ඇලවල්, එල්ලංගාවේ සෑම වැවකම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධාන වල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. | | | | | | |
| 7 | එල්ලංගාව තුළ පිහිටි ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක් පැවැත්වීම. | | | | | | |
| 8 | ජල භාවිතය පිලිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ජල මාපක සවි කිරිම සහ ඒ අනුව ජලය යොදා දීම සඳහා ගොවි සංවිධානය මෙහෙය වීම. | | | | | | |
| 9 | ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිරන්තර හා අඛන්ඩව වැව් පද්ධතිය නඩත්තු කිරීමට සෑම ගොවි සංවිධානයක් සඳහාම තණ කොළ කපන යන්ත්‍රයක් ඇතුලු නඩත්තු උපකරණ කට්ටලයක් ලබා දීම. | | | | | | |
| 10 | එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව්, ඒවායේ ඇළ මාර්ග, නිර්මිත හා එල්ලංගා පද්ධතිය තුල ස්වාභාවික ජලමාර්ග නඩත්තු කිරීම සඳහා වාර්ෂික නඩත්තු සැලැස්මක් සැකසීම හා ඒ අනුව ඒවා නඩත්තු කිරීමට ගොවි සංවිධාන ඇතුලු අදාල පාර්ශව යොමු කරවීම. | | | | | | |
| 11 | එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් වල ජලය බෙදා හැරීම, ගංවතුර අවස්ථාවකදී කටයුතු කල යුතු ආකාරය දැක්වෙන ස්ථාවර මෙහෙයුම් නියෝග (**Standard** | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **Operation Procedure – SOP)** සැකසීම හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පසුවිපරම් කිරීම. | | | | | | |
| 12 | සෑම වගා කන්නයකදීම එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමක් පවත්වා පවතින ජල තත්වයන් හා ඉදිරියේදී ඇති විය හැකි වර්ෂාව සලකා බලා කන්නයේ වගා කටයුතු පිලිබඳ මූලික තීරණ ගැනීම. | | | | | | |
| 13 | එල්ලංගා පද්ධතිය තුල ඉතාමත්ම අබලන්ව පවතින කෘෂි මාර්ග අලුත්වැඩියා කිරීම. | | | | | | |
| 15 | එල්ලාංගාව සුරකීම පිළිබඳව පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් විදී නාට්‍ය, බැනර්, පොස්ටර්, රැස්වීම් මගින් දැනුවත් කිරීම. | | | | | | |
| | එකතුව | | | | | | |

## 5.4. එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය

එල්ලංගා කළමණාකරන කමිටුව විසින් එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වන අතර එය දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට දැන ගැනීම සඳහා ඉදිරිපත් කල යුතුය. ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එල්ලංගා කළමණාකරන කමිටුව අදාල හවුල්කාර ආයතන වලද සහාය ඇතිව සංකල්ප පත්‍රිකා හෝ උප ව්‍යාපෘති යෝජනා (ඇමුණුම් අංක 04) සකස් කර ඒවා මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා අරමුදල් ලබා දෙන ආයතන වෙත ඉදිරිපත් කල යුතුය. ප්‍රධාන හවුල්කාර ආයතන එනම් හඳුනාගත් මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින ආයතන තාක්ෂණික සැලසුම්, අයවැය වාර්තා සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කර ආධාර ලබාදෙන ආයතන වෙත යෝජනා ඉදිරිපත් කිරීම සඳහා එල්ලංගා කලමණාකරන කමිටුවට සහාය ලබාදිය යුතුවේ. උප ව්‍යාපෘති වාර්තා ක්‍රියාත්මක කිරීමේ තත්වය පිලිබඳ සමාජ විගණනය (Social Auditing) සඳහා ගොවි සංවිධාන වල සහාය ඇතිව ප්‍රතිලාභීන් අතුරින් සමාජ විගණන කමිටු (Social Audit Committees) පත් කර ප්‍රතිලාභීන්ගේ ද ක්‍රියාකාරී දායකත්වය ලබාගෙන එල්ලංගා කළමණාකරන කමිටුව විසින් ඉටුකරනු ලබන වැඩ වල ගුණාත්මකභාවය ඉහල නංවා ගැනීම සඳහා කටයුතු කල යුතුවේ.

## 5.5. එල්ලංගා කළමණාකරන සැලැස්මේ ක්‍රියාත්මක තත්වය සොයාබැලීම (Monitoring) / පසුවිපරම

එල්ලංගා කළමණාකරන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම එල්ලංගා කළමණාකරන කමිටුවට පැවරේ. ඒ අනුව උප ව්‍යාපෘති වාර්තා අනුමත කිරීම, ඒ සඳහා අරමුදල් සපයා ගැනීම, ක්‍රියාත්මක තත්වය පසුවිපරම් කිරීම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සිදු කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව විසින් අනුමත කරනු ලබන සෑම වැඩසටහනක්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම එල්ලංගා කළමණාකරන කමිටුවේ සාමාජිකයන් වන ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත පැවරේ.

එල්ලංගා කළමණාකරන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ තත්වය ඒ සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන විසින් පසු විපරම් කල යුතු පසුවිපරම් ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වන ආයතන හා එම ආයතන විසින් පසු විපරම් කල යුතු කාලය පහත වගු අංක 18 හි දැක්වේ.

*වගුව 18 -එල්ලංගා කළමණාකරන සැලැස්ම*

| ආයතනය | කාලය |
|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | මාස 6 කට වරක් |
| දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව | මාස 2 කට වරක් |
| ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව | මාසිකව |
| එල්ලංගා කළමණාකරන කමිටුව | මාසිකව |
| ක්‍රියාත්මක කිරීමේ ආයතන | මාසිකව |
| සමාජ විගණන කමිටුව | සතිපතා |

එල්ලංගා කළමණාකරන සැලැස්මේ ඇතුලත් ප්‍රධාන ක්‍රියාකාරකම් පසු විපරම් කිරීම සඳහා නිශ්චිත (Specific), මැනිය හැකි (Measurable), ලඟාකර ගත හැකි (Achievable), තාත්වික (Realistic), කාලරාමුවක් (Time Bound) සහිත, කාර්ය සාධන දර්ශක (Key Performance Indicator – KPI) සකස් කල යුතුය. එම කාර්ය සාධන දර්ශක මැනිය හැකි ආකාරයට අවශ්‍ය තොරතුරු ලබා ගෙන අදාල ආයතන විසින් ක්‍රියාත්මක සැලැස්ම පසු විපරම් කල යුතු ය. මෙම තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර සැකසිය යුතුය.

## 06. ඇමුණුම්

ඇමුණුම් 01 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍රලේඛය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My No. 7/3/9/CMC/2023 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023.08.03

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>
**<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ විවිධ ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී පරිසර තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල පරිභෝජනයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்க்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා අනෙකුත් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම් කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xii. කෘෂිකර්මයට හා ජල පරිභෝජනයට අදාළ වන පරිසර පද්ධති හා සම්බන්ධ සාම්ප්‍රදායික නීති හා පනවන ලද නීති බලාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.

xiii. ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ රැස්වීම (වගා කන්න රැස්වීම) පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික තීරණ ගැනීමට ගොවීන්ට සහාය වීම, ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පසුවිපරම් කිරීම.

xiv. එල්ලංගා පද්ධති බල ප්‍රදේශය තුළ සියලු ජල මූලාශ්‍ර සහ ඊට අනුබද්ධ අනිකුත් පරිසර පද්ධති වල තිරසර බව සඳහා අදාල රාජ්‍ය ආයතනවල මඟ පෙන්වීම හා උපදෙස් අනුගමනය කරමින් සංරක්ෂණය කරවීමට ක්‍රියාමාර්ග ගැනීම.

xv. එල්ලංගා පද්ධතියට හානිකරන පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

xvi. එල්ලංගා පද්ධතියේ සැම සංවර්ධන ක්‍රියාවලියකදීම ඒ සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීම හා ප්‍රගති සමාලෝචනය කිරීම.

xvii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම.

xviii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල මෙහෙයුම් හා නඩත්තු වැඩසටහන පසුවිපරම් කිරීම.

## 3.4. <u>එල්ලංගා පද්ධති කලමණාකරණ</u> <u>කමිටුවේ සංයුතිය</u>

### 3.4.1 <u>ප්‍රාදේශීය මට්ටම</u>

මෙම කමිටුව අදාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

**i.** ප්‍රාදේශීය ලේකම්
**ii.** ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
**iii.** කෘෂිකර්ම උපදේශක
**iv.** පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී
**v.** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රාදේශීය ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී
**vi.** කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
**vii.** ග්‍රාම නිලධාරී
**viii.** සමෘද්ධි සංවර්ධන නිලධාරී
**ix.** ආර්ථික සංවර්ධන නිලධාරී
**x.** ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
**xi.** පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
**xii.** ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
**xiii.** පරිසර අධිකාරියේ නියෝජිතයෙකු
**xiv.** පොලිස් පරිසර ඒකකයේ නියෝජිතයෙකු
**xv.** සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
**xvi.** කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙකු
**xvii.** වාරි මාර්ග ඉංජිනේරු/තාක්ෂණ නිලධාරී
**xviii.** වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
**xix.** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
**xx.** භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
**xxi.** ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
**xxii.** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
**xxiii.** සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
**xxiv.** පළාත් පාලන ආයතන නියෝජනය කරමින් බලයලත් නිලධරයකු
**xxv.** ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන, නිෂ්පාදන ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් එක් ගොවි සංවිධානයේ සභාපති හෝ ලේකම්
**xxvi.** ප්‍රජා ජල සංවිධානයක නියෝජිතයෙක්

xxvii. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2 <u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධාරීන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරී හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරී හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරී
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරී
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරී හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

සැ:යු :- ***එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ ඒකකව වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.***

**3.5. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම**

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සැම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

**3.6. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම**

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සැම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටුවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)

**ඇමුණුම් අංක 02 - හරස්කඩ චාරිකාව සඳහා සහභාගී වූ හවුල්කාර ආයතන වල ලේඛණය**

1. ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
5. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
6. ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය
7. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව - හම්බන්තොට
8. ගොවි සංවිධාන

**ඇමුණුම් අංක 03 - එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම සහ එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා සහභාගී වූ ආයතන වල ලේඛණය**

1. ලුණුගම්වෙහෙර  ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
4. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
5. දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය,හම්බන්තොට
6. ගොවි සංවිධාන

## ඇමුණුම් අංක 04 - උප ව්‍යාපෘති යෝජනා ආකෘතිය

**මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් ලබා ගැනීම සඳහා උප ව්‍යාපෘති යෝජනාවක් (SPPs) සකස් කිරීමේ ආකෘතිය.**

**1.** පරිපාලන විස්තර:

| අනු අංකය | කරුණු | විස්තර |
|---|---|---|
| 1 | යෝජනා ඉදිරිපත් කරන නියෝජිතායතනයේ සම්බන්ධතා විස්තර: (තැපැල්, විද්‍යුත් තැපැල, දුරකථන ආදිය) | |
| 2 | ක්‍රියාත්මක කරන නියෝජිතායතනයේ සම්බන්ධතා විස්තර: (තැපැල්, ඊමේල්, දුරකථන ආදිය) | |
| 3 | යෝජනාවේ තොරතුරු සැපයීම සඳහා වගකිව යුතු පුද්ගලයාගේ තනතුර සමඟ සම්බන්ධතා විස්තර (ඊමේල්, දුරකථන - ඉඩම / ජංගම) | |
| 4 | යෝජනාවේ අංශය (වැව් ප්‍රතිසංස්කරණය / ජල පෝෂක ප්‍රතිකාර / කෘෂිකාර්මික භාවිතයන් / අලෙවිකරණය / ආයතනික සංවර්ධනය / තාක්‍ෂණය මාරු කිරීම / පුහුණු කිරීම / වෙනත් (නිශ්චිත කරන්න). | |
| 5 | ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ (DAC) එකඟතාවයේ අංකය. | |

**2. උප ව්‍යාපෘති විස්තර:**

**2.1.** උප-ව්‍යාපෘතියේ මාතෘකාව (මෙම නම ව්‍යාපෘති සංවර්ධන අරමුණට බොහෝ දුරට සමාන විය හැකි නමුත් සෑම විටම නොවන බව කරුණාවෙන් සලකන්න):

………………………………………………………………………………………………………

**2.2.** උප ව්‍යාපෘතියේ සාරාංශය (කරුණාකර එය කුමක්ද, ඇයි, එය කවුද, එය කොහේද සහ එය ක්‍රියාත්මක කරන්නේ කවදාද යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන ඉතා කෙටි ඡේදයක් දෙන්න? ඇස්තමේන්තුගත මුළු පිරිවැය ද අවශ්‍ය වේ)

.

………………………………………………………………………………………………………

**2.3.** ව්‍යාපෘතියේ පිහිටීම (එල්ලංගාව , ගොවිජන සේවා මධ්‍යස්ථානය, පළාත් පාලන ආයතනය , ග්‍රාම නිලධාරී වසම යනාදී විස්තර. ව්‍යාපෘති පිහිටීම ගංවතුර හෝ නියඟයට ගොදුරු විය හැකි ප්‍රදේශයක් ලෙස සලකන්නේ නම්, කරුණාකර එය ද දක්වන්න).

………………………………………………………………………………………………………

**2.4.** ව්‍යාපෘති ගැටළු/තාර්කික/සාධාරණීකරණය (මෙය ඉතා වැදගත් වන අතර යෝජනාවේ ප්‍රධාන කොටස ලෙස සැලකේ. එම නිසා කරුණාකර ගැටලුව කුමක්ද, එය ගොවීන්ට බලපාන්නේ කෙසේද, එය හඳුනාගත් ආකාරය සහ සිදුවන අයහපත් ප්‍රතිඵල මොනවාද යන්න ඉස්මතු කරන්න.(එම ගැටළු විසඳා නැත්නම් )

.

………………………………………………………………………………………………………

**2.5.** තීරණාත්මක ගැටලුව හඳුනාගත්තේ කෙසේද? (ප්‍රජා උපදේශන, ගොවි සංවිධානවල ඉල්ලීම්, එල්ලංගා කළමනාකරණ සැලැස්ම යනාදිය හරහා)

.

………………………………………………………………………………………………………

**2.6.** උප ව්‍යාපෘතියේ පරමාර්ථය (අධීක්ෂණ කාර්යය සඳහා වැදගත් වන බැවින් කරුණාකර මෙය ඉතා තාර්කික ආකාරයෙන් සකස් කරන්න).

……………………………………………………………………………………………………

**2.7.** **නිශ්චිත අරමුණු (SMART ආකෘතියට අනුව නිශ්චිත අරමුණු සංවර්ධනය කළ යුතු අතර මෙය අධීක්ෂණ කාර්යය සඳහා ද ඉතා වැදගත් වේ.**

**1.**

**2.**

**2.8.** **යෝජිත උප-ව්‍යාපෘති ක්‍රියාකාරකම් (මෙම කොටස ඉතා තාර්කිකව විස්තර කිරීමට අවශ්‍ය වන අතර තීරණාත්මක ගැටළුව විසඳීමට ක්‍රියාත්මක කරන ආයතනය යෝජනා කළ ක්‍රියාමාර්ග මොනවාද සහ එය ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීමට දායක වන්නේ කෙසේද?**

……………………………………………………………………………………………………

**2.9.** **අපේක්ෂිත ප්‍රතිඵල (මේවා ආර්ථික, දේශපාලනික, සමාජීය, පරිසරය, සංස්කෘතික, පෝෂණ ආදිය විය හැක)**

**1.**

**2.**

**2.10.** **ප්‍රතිලාභීන් (ප්‍රතිලාභීන්ගේ ස්වභාවය - පිරිමි සහ ගැහැණු සංඛ්‍යාවට අමතරව, යුද්ධයෙන් පීඩාවට පත් වූ අඩු ආදායම්ලාභී හෝ ආදිවාසී කණ්ඩායම්වලට අයත් වීම වැනි වෙනත් ලක්ෂණ ද දක්වන්න.)**

……………………………………………………………………………………………………

**2.11.** **ක්‍රියාවට නැංවීමට සහභාගී වන්නේ ප්‍රතිලාභීන්ගෙන් කවුරුන්ද?**

**2.12.** **කාන්තාවන්ට ප්රතිලාභ ලැබෙන්නේ කෙසේද?**

……………………………………………………………………………………………………

**2.13.** **O&M සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඇතුළුව මෙහෙයුම් සහ නඩත්තු (O&M) සඳහා වගකිව යුත්තේ කවුද?**

……………………………………………………………………………………………………

**2.14. විභව අවදානම් සහ අවදානම් අවම කිරීමට උපාය මාර්ගික යෝජනා**

**2.15. ව්‍යාපෘතිය සෘණ ලැයිස්තුවට හෝ නියමිත ලැයිස්තුවට වැටෙන්නේද?**

**(a) ඔව් නම්, කරුණාකර IEE හෝ EIA අවශ්‍ය දැයි පැහැදිලි කරන්න.**

……………………………………………………………………………

**(b) නැත නම්, IEER/EIS ආකෘතිය අවශ්‍ය වේ.**

**2.16.** උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ විය හැකි යෝජිත ගොවි සංවිධානවල හෝ නිෂ්පාදක සංවිධානවල නම්/නම් (අදාළ නම්, විස්තර අමුණන්න අවශ්‍ය වේ)

……………………………………………………………………………………………………

**3.** ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

**3.1.** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත්තේ කෙසේද සහ කුමන පාර්ශ්වකරුවන් සමඟද? (ප්‍රමාණවත් විස්තර සහිතව විස්තර කරන්න)

……………………………………………………………………………………………………

**3.1.** ටෙන්ඩර් ක්‍රියාවලිය (අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට සැලසුම් කර ඇති ආකාරය පැහැදිලි කරන්න).

**3.2.** ක්‍රියාකාරි සැලැස්ම (කාල රාමුව සහ ක්‍රියාත්මක කරන වගකිවයුතු ආයතන/පුද්ගලයින් සමඟ ක්‍රියාකාරකම් සැලැස්ම විස්තර කරන්න. මෙය Gantt ප්‍රස්ථාරයක් භාවිතයෙන් විස්තර කළ යුතුය).

**4.** උප ව්‍යාපෘතිය අධීක්ෂණ යාන්ත්‍රණය: (මෙය ඉතා වැදගත් වේ. එබැවින් ප්‍රමාණවත් විස්තර සපයමින් අධීක්ෂණ කටයුතු සිදු වන ආකාරය විස්තර කරන්න).

.......................................................................................................................................................

**5.** උප ව්‍යාපෘති ඇගයුම් යාන්ත්‍රණය: (කරුණාකර ක්‍රියාත්මක කරන ආයතනය ව්‍යාපෘතිය ඇගයීමට සැලසුම් කරන්නේ කෙසේද සහ කුමන කාල පරාසයන් වලදීද යන්න දක්වන්න)

……………………………………………………………………………………………………

**6.** වාර්තාකරණ විධිවිධාන (මූල්‍ය සහ ප්‍රගති වාර්තාකරණය සහ අපේක්ෂිත කාලසීමාව යන දෙකම සිදුකිරීමේ වගකීම භාරගන්නේ කවුරුන්ද යන්න විස්තර කරන්න)

7. ඇස්තමේන්තුගත පිරිවැය:

| අංකය | ප්‍රධාන කාර්යය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් වලින් | ප්‍රජා දායකත්වය රුපියල් | වෙනත් මූලාශ්‍ර (නිශ්චිත) රුපියල් | දායක නියෝජිතායතනයෙන් අපේක්ෂිත මුදල රුපියල් |
|---|---|---|---|---|---|
| **1** | | | | | |
| **2** | | | | | |

**8.** ඉදිරිපත් කිරීම

**8.1.** එල්ලංගා කළමනාකරණ කමිටුව (CMC) වෙනුවෙන් උප ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීමට බලයලත් පුද්ගලයා

**8.2.** තනතුර, සම්බන්ධතා තොරතුරු, මුද්‍රාව, ඉදිරිපත් කළ දිනය

**09.** ඇමුණුම් :

**(උප ව්‍යාපෘති යෝජනාව සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු සැපයීමට සහ එමගින් අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා කරුණාකර අදාළ සියලුම අමතර විස්තර අමුණන්න.)**